NATIONAL ZOO SRI LANKA

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
අනගාරික ධර්මපාල මාවත
දෙහිවල
0112712751-3
www.nationalzoo.gov.lk
zoosl@slt.lk

වාර්ෂික කාර්යසාධන වාර්තාව
வருடாந்த செயல்திறன் அறிக்கை
Annual Performance Report
2022



NATIONAL ZOO SRI LANKA
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
தேசிய மிருகக் காட்சிச்சாலைத் திணைக்களம்
Department of National Zoological Gardens

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
வனசீவராசிகள் மற்றும் வன வளங்கள் பாதுகாப்பு அமைச்சு
Ministry of Wildlife and Forest Resources Conservation

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2022

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය

2022 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
වැය ශීර්ෂ අංකය - 294

පටුන

වගු ලැයිස්තුව ..... **IV**
ප්‍රස්තාර ලැයිස්තුව ..... **V**
රූප සටහන් ලැයිස්තුව ..... **V**

01. පරිච්ඡේදය 1

ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 1

1.1 හැඳින්වීම 1
1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු 1
1.3 ප්‍රධාන කාර්යයන් 2
1.4 සංවිධාන සටහන 2
1.5 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව 4
1.5.2 **2022.12.31** වන දිනට මූල්‍ය ප්‍රගති සාරාංශය 7
1.5.3 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගති සාරාංශය 8
1.5.4 **2022.12.31** වන දිනට සත්ත්ව එකතුව 9
1.5.5 දෙපාර්තමේන්තුව විසින් සිදු කරන සත්ත්ව හුවමාරු වැඩසටහන් හා සතුන් මිලදී ගැනීම 9
1.6 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආයතන හා එහි කාර්යයන් 10
1.6.1 දෙහිවල ජාතික සත්වෝද්‍යානය 10
1.6.2 පින්නවල අලි අනාථාගාරය 12
1.6.3 පින්නවල සත්වෝද්‍යානය 15
1.6.4 රිදියගම සෆාරි උද්‍යානය 17
1.6.5 ගෝනපොල සත්වෝද්‍යාන ගොවිපළ 19
1.7 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 20
1.7.1 රජයේ ඒකාබද්ධ අරමුදල 20
1.7.2 සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල 22

02. පරිච්ඡේදය 23

ප්‍රගතිය හා ඉදිරි දැක්ම 23

03. පරිච්ඡේදය 25

වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය 25

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 25
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 26
3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 27
3.4 මූල්‍ය ප්‍රකාශ සටහන් 29
3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 30
3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 30

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන..... 30
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 30
3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව 30
04. පරිච්ඡේදය 31

කාර්ය සාධන දර්ශක..... 31

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)..... 31
05. පරිච්ඡේදය 33

තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 33

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු..... 33
5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහන හා අභියෝග 34
06 පරිච්ඡේදය 35

මානව සම්පත් පැතිකඩ..... 35

5.3 සේවක සංඛ්‍යා කළමනාකරණය..... 35
6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම. 35
6.3 මානව සම්පත් සංවර්ධනය 35
07 පරිච්ඡේදය 37

අනුකූලතා වාර්තාව..... 37

වගු ලැයිස්තුව

වගු සටහන 1.1	2022 වසරේ සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම (මාසිකව)	4
වගු සටහන 1.2	දෙපාර්තමේන්තුව යටතේ පවතින උප ආයතන වෙත සංචාරක පැමිණීම සහ ආදායම	5
වගු සටහන 1.3	2021 – 2022 වර්ෂය දක්වා සංචාරකයන්ගේ පැමිණීම සහ ආදායම	5
වගු සටහන 1.4	2010 වසරේ සිට 2022 වසර දක්වා සංචාරක පැමිණීම සහ ආදායම	6
වගු සටහන 1.5	2022.12.31 දිනට ප්‍රතිතිපාදන හා වියදම් තොරතුරු සාරාංශය (ඒකාබද්ධ අරමුදල)	7
වගු සටහන 1.6	2022.12.31 දිනට වියදම් තොරතුරු සාරාංශය	7
වගු සටහන 1.7	2022.12.31 දිනට ඒකාබද්ධ අරමුදලේ සංවර්ධන කටයුතු වල මූල්‍ය ප්‍රගති සාරාංශය	8
වගු සටහන 1.8	2022.12.31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ මූල්‍ය ප්‍රගතිය	8
වගු සටහන 1.9	2022.12.31 දිනට සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මුළු සත්ත්ව එකතුව	9
වගු සටහන 1.10	2022.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව	10
වගු සටහන 1.11	2022.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	10
වගු සටහන 1.12	2022.12.31 දිනට දෙහිවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය	10
වගු සටහන 1.13	2022 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්	10
වගු සටහන 1.14	2022.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව එකතුව	12
වගු සටහන 1.15	2022.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	12
වගු සටහන 1.16	2022 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්	12
වගු සටහන 1.17	2022.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය	14
වගු සටහන 1.18	2022.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව	16
වගු සටහන 1.19	2022.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	16
වගු සටහන 1.20	2022 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්	16
වගු සටහන 1.21	2022.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය	16
වගු සටහන 1.22	2022.12.31 දිනට හම්බන්තොට සෆාරි උද්‍යානයේ සත්ත්ව එකතුව	17
වගු සටහන 1.23	2022.12.31 දිනට හම්බන්තොට සෆාරි උද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	18
වගු සටහන 1.24	2022.12.31 දිනට හම්බන්තොට සෆාරි උද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය	18
වගු සටහන 1.25	2022 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්	18
වගු සටහන 1.26	2022.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව එකතුව	19
වගු සටහන 1.27	2022.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව අභිජනන සංඛ්‍යාව	20
වගු සටහන 1.28	වියදම් තොරතුරු - රජයේ ඒකාබද්ධ අරමුදල	20
වගු සටහන 1.29	වියදම් තොරතුරු - සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල.	22
වගු සටහන 3.1	මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය	25
වගු සටහන 3.2	මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය	26
වගු සටහන 3.3	මුදල් ප්‍රවාහ ප්‍රකාශය	27

වගු සටහන 3.4	ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය	30
වගු සටහන 3.5	වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය	30
වගු සටහන 3.6	මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය	30
වගු සටහන 4.1	ආයතනයේ කාර්ය සාධන දර්ශක	31
වගු සටහන 5.1	හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු	33
වගු සටහන 6.1	සේවක සංඛ්‍යා කළමනාකරණය	35
වගු සටහන 7.1	අනුකූලතා වාර්තාව	37

ප්‍රස්තාර ලැයිස්තුව

ප්‍රස්තාර සටහන 1.1	ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - සංවිධාන සටහන	3
ප්‍රස්තාර සටහන 1.2	2022 වසරේ සංචාරකයින්ගේ පැමිණීම	5
ප්‍රස්තාර සටහන 1.3	2022 වසරේ දෙපාර්තමේන්තුවේ ආදායම	6
ප්‍රස්තාර සටහන 1.4	2010 - 2022 දක්වා සංචාරක පැමිණීම	7
ප්‍රස්තාර සටහන 1.5	2010 - 2022 දක්වා දෙපාර්තමේන්තුවේ ආදායම රු.මි.	7

රූප සටහන් ලැයිස්තුව

රූප සටහන 1.1	සිංහ අරණ අලුත්වැඩියා කටයුතු	11
රූප සටහන 1.2	මැකෝ ගිරවුන් සඳහා අරණ	11
රූප සටහන 1.3	නව අලි මඩු ඉදිකිරීම	14
රූප සටහන 1.4	හදිසි අවස්ථාවක දී භාවිතා කළහැකි ගේට්ටු සහ වැට	14
රූප සටහන 1.5	විදුලි බලය බෙදා හැරීමේ පද්ධතියේ අලුත්වැඩියා කටයුතු	15
රූප සටහන 1.6	විදුලි බලය බෙදා හැරීමේ පද්ධතියේ අලුත්වැඩියා කටයුතු	17
රූප සටහන 1.7	කබල්ලෑවා සඳහා වූ අරණ	17
රූප සටහන 1.8	ආසියානු අලි කලාපය සහ වීටා කලාපය අතර අඩි 16 උස වේන් ලින්ක් වැට	19
රූප සටහන 1.9	සිංහ ගුහාය	19

01.පරිච්ඡේදය
ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

ජර්මන් ජාතික ජෝන් හාර්ගෙන්බෙක් මහතා විසින් වර්ෂ 1905 දී පමණ වනගත අලි ඇතුන් අල්ලා ජර්මනියේ පිහිටි හැම්බර්ග් නගරයට අපනයනය කිරීමට පෙර, රඳවා තබා ගන්නා ස්ථානයක් ලෙස අක්කර 5ක භූමි ප්‍රමාණයක දෙහිවල සත්වෝද්‍යානය ආරම්භ කර ඇත. පසුව, කාලයත් සමඟ සත්වගාලෙහි රඳවා සිටින අලි ඇතුන් හා වෙනත් සත්ත්ව විශේෂයන් නැරඹීමට පැමිණෙන අති විශාල ජනතාව හේතුවෙන් අක්කර 11 ක භූමි ප්‍රමාණයකට පුළුල් කර වර්ෂ 1926 දී මෙය ‘‘ලංකා සත්ත්ව උද්‍යාන සමාගම’’ (Ceylon Zoological Gardens Company) ලෙස නම් කර ඇත.

වර්ෂ 1933 දී ඇතිවූ දෙවන ලෝක මහා සංග්‍රාමයත් සමඟ එම සමාගම බ්‍රිතාන්‍ය යටතට පත් වී ඇති අතර, 1935 පමණ වනවිට සත්ත්ව උද්‍යාන සමාගමේ ජීවත් වූ වන සතුන් සීඝ්‍රයෙන් බෝවීමත්, ඔවුන්ට ප්‍රමාණවත් ඉඩකඩ හා ආහාරපාන නොමැති වීමත් මත ලංකා සත්වෝද්‍යාන සමාගම බංකොලොත්භාවයට පත් වී ඇත.

පසුව, වන සත්ත්ව ලෝලියෙකු වූ ඕස්ට්‍රේලියානු ජාතික මේජර් ඕබරි එන්. වයිමන් මහතා විසින් බ්‍රිතාන්‍ය ආණ්ඩුව වෙත සිදුකළ දැඩි ඉල්ලීමක ප්‍රතිඵලයක් ලෙස, වර්ෂ 1936 ජූලි මස 03 වන දින ලංකා සත්ත්ව උද්‍යාන සමාගම රජයට පවරාගන්නා ලද අතර, උද්‍යානය අක්කර 23 ක භූමිභාගයක් දක්වා පුළුල් කර ඇත. පසුව, 1962 වර්ෂයේ දී මෙය ‘‘ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව’’ ලෙස ප්‍රකාශයට පත් කරමින් ස්වාධීන දෙපාර්තමේන්තුවක් ලෙස මෙහි පාලන කටයුතු 1982 අංක 41 දරණ ජාතික සත්ත්ව උද්‍යාන පනතේ විධිවිධාන අනුව කටයුතු සිදු කර ඇත.

වර්තමානය වනවිට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන දෙහිවල සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානය සහ හම්බන්තොට සෆාරී උද්‍යානය යන ප්‍රධාන මෙහෙයුම් ඒකක 04 මඟින් සත්ත්වයින් විතැන් සංරක්ෂණය සිදු කරනු ලබයි. මීට අමතරව, සත්වෝද්‍යාන සඳහා අවශ්‍ය සත්ත්ව ආහාර නිෂ්පාදනය කිරීමේ කටයුතු සිදු කරන ගෝනපොළ, කහපොළ සහ දියගම ප්‍රදේශවල පවත්වාගෙන යන සත්වෝද්‍යාන ගොවිපළවල්, දෙපාර්තමේන්තුව යටතේ පාලනය වේ. මේ අනුව, දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මෙහෙයුම් කටයුතු දෙහිවල සත්වෝද්‍යාන පරිශ්‍රයේ දී සිදු කරනු ලබන අතර, සියලු උප ආයතන එක්ව දෙපාර්තමේන්තුවේ අරමුණු ළඟා කරගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලබයි.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

‘‘ලෝකයේ විශිෂ්ටතම සත්වෝද්‍යාන පවත්වා ගෙන යනු ලබන ආයතනයක් බවට පත්වීම.’’

මෙහෙවර

‘‘නවීන සත්වෝද්‍යාන සංකල්ප යටතේ, ආකර්ෂණීය ශිල්පීය ක්‍රම සහ ප්‍රවීණතාවයන් උපයෝගී කර ගනිමින්, පිළිගත් නීති රීතිවලට අනුකූලව උපරිම රැකවරණය යටතේ නිවහන සපයමින්, විවිධත්වයෙන් යුතු සෞඛ්‍ය සම්පන්න සත්ත්ව එකතුවක් ප්‍රදර්ශනය කිරීම.’’

අරමුණු

- සත්ත්ව අභිජනනය හා සංරක්ෂණය
- සත්ත්ව සුබසාධනය
- අධ්‍යාපනය
- පර්යේෂණ
- ප්‍රදර්ශනය හා විනෝදාස්වාදය ලබා දීම

1.3 ප්‍රධාන කාර්යයන්

පහත සඳහන් කාර්යයන්හි නියැලෙමින් ආයතනික අරමුණු ළඟා කරගැනීමට කටයුතු කරනු ලබයි.

- ස්වාභාවික තත්ත්වයට ආසන්න වාසභූමියක් තුළ විවිධත්වයෙන් යුතු දේශීය හා විදේශීය සත්ත්ව එකතුවක් පවත්වාගෙන යාම.
- ජාත්‍යන්තර සංගම් සහ සත්වෝද්‍යාන ජාලය තුළ ක්‍රියාකාරී ලෙස සහභාගීවීම සහ සබඳතා ඇතිකර ගැනීම සහ සත්ත්ව හුවමාරු වැඩසටහන්වලට සහභාගීවීම.
- තර්ජනයට ලක්ව ඇති, වඳ වීමට ලක්ව ඇති සහ රටේ ආවේණික සත්ත්ව විශේෂයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරමින් වන සත්ත්ව විශේෂයන්ගේ පරිභාහිර සංරක්ෂණය සහතික කිරීම.
- සත්ත්වයන් සහ අනෙකුත් සත්වෝද්‍යාන ශික්ෂණයන් පිළිබඳ වූ දැනුම පුළුල් කර ගැනීම සඳහා පර්යේෂණ පැවැත්වීම.
- සතුන්ගේ ජීවන ක්‍රියාවලියට අවම බාධාවන් වන අයුරින්, දැනුම වර්ධනය කිරීමට සහ විනෝදාශ්වාදය ලබාදීම සඳහා සතුන් ප්‍රදර්ශනය කිරීම.
- පාරිසරික සංචරණය ප්‍රවර්ධනය කරමින් සහ ප්‍රදර්ශනය කිරීමේ නවීන සංකල්ප මඟින් සංචාරක කර්මාන්තයේ අවශ්‍යතා ඉටුකිරීම.
- පාසල් දරුවන්ගේ අවිධිමත් අධ්‍යාපනය සඳහා සහයවීමක් වශයෙන් දුරස්ථ අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම.
- පොදු ජනතාව සමඟ සහ පාසල් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් වැදගත් අධ්‍යාපනික වැඩසටහන් දියත් කිරීම.
- සත්වෝද්‍යාන වෙත ලැදියාවක් දක්වන විශේෂ සංවිධාන, දේශීය සහ විදේශීය ස්වේච්ඡා සේවකයන්, ශිෂ්‍යයින් සහ වැඩ කිරීමට ලැදියාවක් දක්වන කණ්ඩායම් දිරිමත් කිරීම.
- ශාක භක්ෂක සතුන් සඳහා ආහාර සැපයීමේ ගොවිපොළවල්, ශ්‍රවණාගාර, සත්ත්ව රෝහල්, වෙන් වෙන් වශයෙන් පිහිටවූ සේවා ඒකක, කෞතුකාගාර සහ පුස්තකාල වැනි උපකාරක සේවා සංවර්ධනය කිරීම.
- සත්වෝද්‍යාන තුළ අඛණ්ඩ නඩත්තු කිරීම් සහ සේවකයන් සඳහා ශ්‍රේණිය/සේවා උසස් කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.

1.4 සංවිධාන සටහන

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයට අදාළ සංවිධාන සටහන පිටු අංක 03 හි දැක්වේ.

ප්‍රස්තාර සටහන 1.1

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - සංවිධාන සටහන



මූලාශ්‍රය 1.1 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

1.5 ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පවතින මෙහෙයුම් ආයතන

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය දෙහිවල සත්ත්ව උද්‍යාන පරිශ්‍රය තුළ ස්ථාපිත කර ඇති අතර, දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන දෙහිවල සත්වෝද්‍යානය, පින්නවල අලි අනාථාගාරය, පින්නවල සත්වෝද්‍යානය සහ හම්බන්තොට සෆාරී උද්‍යානය මෙන්ම ගෝනපොළ ගොවිපොළ යන ප්‍රධාන මෙහෙයුම් ඒකක 05 මේ යටතේ ක්‍රියාත්මක වේ. සත්ත්ව ප්‍රදර්ශන කටයුතු සිදු කිරීමත්, එතුළින් උපයා ගනු ලබන ප්‍රවේශපත්‍ර ආදායම සහ අනෙකුත් ආදායම් ඇතුළුව 2022 වර්ෂය තුළ දෙපාර්තමේන්තුවේ සමස්ත ආදායම රු.මි. 535.09ක් ලෙස වාර්තා විය (වගු සටහන 1.1 සහ 1.2).

1.5.1 2022.12.31 දිනට සංචාරක පැමිණීම සහ ආදායම

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මහජනතාව වෙනුවෙන් සෑම දිනකම විවෘතව තැබූ ආයතනයක් වූ අතර, පසුගිය වසර දෙකක කාලය තුළ පැවති කොවිඩ් 19 වසංගත ව්‍යාප්තියත් සමඟ සත්වෝද්‍යාන කඩින් කඩ වඩා දැමීමට සිදු විය. නමුත් 2022 වසරේදී සියලු කටයුතු නැවත යථා තත්ත්වයට පත් වීම හේතුවෙන් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අයත් සියලුම ආයතන සඳහා සංචාරක පැමිණීම ඉහළ යාමත්, ආදායම ඉහළ මට්ටමක පවත්වා ගැනීමටත් හැකියාව ලැබුනි. ඒ අනුව, 2022 වසරේ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව යටතේ පවතින උප ආයතන වෙත සංචාරකයින්ගේ පැමිණීම හා එම වසරේ ප්‍රවේශපත්‍ර ආදායම වගු සටහන 1.1 හා 1.2 මඟින් පෙන්නුම් කෙරේ.

වගු සටහන 1.1
2022 වසරේ සංචාරකයින්ගේ පැමිණීම සහ ආදායම (මාසිකව)

මාසය	සංචාරක පැමිණීම			ආදායම (රු.මි.)			
	දේශීය	විදේශීය	එකතුව	දේශීය	විදේශීය	වෙනත්	එකතුව
ජනවාරි	213,179	7,938	221,117	26.65	18.79	4.30	49.73
පෙබරවාරි	202,313	9,363	211,676	25.47	23.17	3.80	52.43
මාර්තු	167,425	11,500	178,925	28.21	24.03	3.44	55.68
අප්‍රේල්	70,419	5,048	75,467	14.71	12.37	1.72	28.81
මැයි	62,023	1,896	63,919	12.21	4.59	2.47	19.27
ජූනි	73,243	1,378	74,621	13.79	3.52	3.27	20.59
ජූලි	49,942	2,149	52,091	9.02	5.51	2.55	17.08
අගෝස්තු	183,671	2,492	186,163	31.84	6.62	10.25	48.72
සැප්තැම්බර්	320,720	1,651	322,371	51.64	3.91	6.23	61.79
ඔක්තෝබර්	272,116	2,892	275,008	46.48	6.53	7.11	60.13
නොවැම්බර්	213,035	4,188	217,223	30.36	10.08	6.84	47.28
දෙසැම්බර්	299,949	7,101	307,050	47.63	14.02	11.94	73.59
එකතුව	**2,128,035**	**57,596**	**2,185,631**	**338,02**	**133.14**	**63.92**	**535.09**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 1.2 දෙපාර්තමේන්තුව යටතේ පවතින උප ආයතන වෙත සංචාරක පැමිණීම සහ ආදායම - 2022								
ආයතනය/ ජාතික උද්‍යානය		සංචාරක පැමිණීම			ආදායම (රු.මි.)			
		දේශීය	විදේශීය	එකතුව	දේශීය	විදේශීය	වෙනත්	එකතුව
1	දෙහිවල සත්වෝද්‍යානය	1,278,222	7,112	1,285,334	177.93	14.33	44.28	236.54
2	පින්නවල අලි අනාථාගාරය	345,986	45,872	391,858	44.80	110.25	6.31	161.35
3	පින්නවල සත්වෝද්‍යානය	248,991	1,871	250,862	33.63	1.25	6.84	41.72
4	රිදියගම සෆාරි උද්‍යානය	254,836	2,741	257,577	81.66	7.32	6.50	95.48
එකතුව		**2,128,035**	**57,596**	**2,185,631**	**338.02**	**133.15**	**63.92**	**535.09**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

පහත වගු සටහන 1.3 අනුව, 2021 වර්ෂයේ සහ 2022 වර්ෂයේ සමස්ත සංචාරක පැමිණීම හා ආදායම මාසික වශයෙන් සංසන්ධනය කිරීමක් සිදු කර ඇත. 2021 වර්ෂය සමඟ සැසඳීමේ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2022 වර්ෂයේ සංචාරක පැමිණීම සියයට 75 ක වර්ධනය වීමක් වාර්තා කර ඇති අතර, වාර්ෂික ආදායම සියයට 80 කින් වර්ධනය වී ඇත.

වගු සටහන 1.3 2021 – 2022 වර්ෂය දක්වා සංචාරකයන්ගේ පැමිණීම සහ ආදායම (මාසිකව)				
මාසය	සංචාරක පැමිණීම		ආදායම (රු.මි.)	
	2021	2022	2021	2022
ජනවාරි	0	221,117	0.37	49.73
පෙබරවාරි	54,121	211,676	8.17	52.43
මාර්තු	82,995	178,925	14.24	55.68
අප්‍රේල්	103,158	75,467	18.51	28.81
මැයි	653	63,919	0.2	19.27
ජූනි	0	74,621	0	20.59
ජූලි	6,507	52,091	1.66	17.08
අගෝස්තු	7,658	186,163	1.95	48.71
සැප්තැම්බර්	250	322,371	0.48	61.79
ඔක්තෝබර්	46,185	275,008	7.61	60.13
නොවැම්බර්	71,175	217,223	18.66	47.28
දෙසැම්බර්	171,952	307,050	37.72	73.59
එකතුව	**544,654**	**2,185,631**	**109.57**	**535.09**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 1.2 : 2022 වසරේ සංචාරකයින්ගේ පැමිණීම (මාසිකව)



ප්‍රස්තාර සටහන 1.3 : 2022 වසරේ දෙපාර්තමේන්තුවේ ආදායම (මාසිකව)



මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

වගු සටහන 1.4
2010 වසරේ සිට 2022 වර්ෂය දක්වා සංචාරක පැමිණීම සහ ආදායම

වර්ෂය	සංචාරක පැමිණීම	ආදායම (රු.මි.)
2010	2,324,360	587.74
2011	2,438,635	651.38
2012	2,196,704	645.29
2013	2,172,810	719.87
2014	2,042,887	906.50
2015	2,781,380	1,034.87
2016	2,959,737	1,097.66
2017	2,885,955	998.62
2018	3,097,341	1006.42
2019	2,443,028	766.13
2020	683,698	204.73
2022	544,654	109.57
2022	2,185,631	535.09

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 1.4 : 2010 - 2022 වර්ෂය දක්වා සංචාරක පැමිණීම



මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ප්‍රස්තාර සටහන 1.5 : 2010 - 2022 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුවේ ආදායම රු.මි.



මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ඉහත ප්‍රස්තාර සටහනට 1.4 සහ 1.5 ට අනුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සංචාරක පැමිණීම හා ප්‍රවේශපත්‍ර ආදායම 2010 වසරේ සිට 2018 දක්වා ක්‍රමයෙන් ඉහළ යාමක් පෙන්නුම් කරනු ලබන අතර, 2019 වසරින් පසු පහළ යාමක් පෙන්නුම් කරන ලදී. ඒ සඳහා රටතුළ පැවති අයහපත් වාතාවරණයත් 2020,2021 වසර තුළදී ලොව පුරා ව්‍යාප්ත වූ කොවිඩ් වසංගත තත්ත්වයත් කැපී පෙණිනි. 2022 වසරින් පසු නැවතත් සියලු කටයුතු යථා තත්ත්වයට පත් වීම මත සංචාරක පැමිණීම මෙන්ම ආදායම සාමාන්‍ය මට්ටමට පත් වෙමින් පවතී.

1.5.2 2022.12.31 වන දිනට මූල්‍ය ප්‍රගති සාරාංශය

වගු සටහන 1.5
2022.12.31 දිනට ප්‍රතිපාදන හා වියදම් තොරතුරු සාරාංශය (ඒකාබද්ධ අරමුදල)

වියදම් කාණ්ඩය	2022 ඇස්තමේන්තු මුදල (රු.මි.)	2022.12.31 දිනට වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය %
මූලධන වියදම්	180.00	146.00	81
පුනරාවර්තන වියදම්	569.00	545.00	96
එකතුව	**749.00**	**691.00**	**92**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 1.6
2022.12.31 දිනට වියදම් තොරතුරු සාරාංශය (සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල)

වියදම් කාණ්ඩය	2022 ඇස්තමේන්තු මුදල (රු.මි.)	2022.12.31 දිනට වියදම (රු.මි.)	මූල්‍ය ප්‍රගතිය %
මූලධන වියදම්	76.02	24.21	32
පුනරාවර්තන වියදම්	827.02	712.89	86
එකතුව	**903.04**	**737.10**	**82**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

1.5.3 ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගති සාරාංශය

රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් හා සත්වෝද්‍යාන සංවර්ධන අරමුදල මඟින් ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය පහත වගු අංක 1.7 හා 1.8 මඟින් දක්වා ඇත.

වගු සටහන 1.7
2022.12.31 දිනට ඒකාබද්ධ අරමුදලේ සංවර්ධන වැඩසටහන් වල මූල්‍ය ප්‍රගති සාරාංශය

අනු අංකය	වැඩසටහන	ප්‍රතිපාදන	මූල්‍ය ප්‍රගතිය	
		(රු.මි.)	(රු.මි.)	%
1	ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව සහ වැඩිදියුණු කිරීම	7.00	4.45	64
2	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	2.50	1.60	64
3	මානව සම්පත් සංවර්ධනය	0.50	0.16	32
4	දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය (1)	50.00	38.66	77
5	පින්නවල අලි අනාථාගාරය සංවර්ධනය (2)	40.00	38.58	96
6	පින්නවල සත්වෝද්‍යානය සංවර්ධනය (3)	40.00	27.46	69
7	රිදියගම සෆාරි උද්‍යානය සංවර්ධනය (4)	40.00	35.00	88
	එකතුව	**180.00**	**145.91**	**92**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන 1.8
2022.12.31 දිනට සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ සංවර්ධන වැඩසටහන්වල මූල්‍ය ප්‍රගති සාරාංශය

අනු අංකය	වැඩසටහන	ප්‍රතිපාදන	මූල්‍ය ප්‍රගතිය	
		(රු.මි.)	(රු.මි.)	%
1	දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය	15.00	12.67	84
2	රිදියගම සෆාරි උද්‍යානය සංවර්ධනය	25.00	2.42	10
3	පින්නවල සත්වෝද්‍යානය	1.00	1.00	100
4	පින්නවල අලි අනාථාගාරය සංවර්ධනය	20.00	0.43	2
5	නව ඉදිකිරීම් සඳහා උපකරණ අත්පත් කර ගැනීම	10.00	4.47	45
6	වෛද්‍ය උපකරණ මිලදී ගැනීම	5.00	3.23	65
7	සතුන් මිල දී ගැනීම	0.01	-	-
8	සතුන් අත්පත් කර ගැනීම සඳහා දරනු ලබන වියදම්	0.01	-	-
	එකතුව	**76.02**	**24.21**	**32**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

1.5.4 **2022.12.31** වන දිනට සත්ත්ව එකතුව

වගු සටහන **1.9** **2022.12.31** දිනට සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මුළු සත්ත්ව එකතුව			
සත්ත්ව වර්ගීකරණය		**විශේෂ/පවුල්**	**සත්ත්වයින්ගේ ප්‍රමාණය**
දෙහිවල ජාතික සත්වෝද්‍යානය			
1	ක්ෂීරපායි	58	258
2	පක්ෂි	69	831
3	උරග	35	163
4	මත්ස්‍ය සහ වෙනත් මුහුදු ජීවීන්	49	1101
5	උභය ජීවීන්	03	06
	එකතුව	**214**	**2359**
පින්නවල අලි අනාථාගාරය			
1	ක්ෂීරපායි - ආසියානු අලි	01	75
	එකතුව	**01**	**75**
පින්නවල සත්වෝද්‍යානය			
1	ක්ෂීරපායි	18	192
2	පක්ෂි	08	48
3	උරග	05	11
	එකතුව	**31**	**251**
හම්බන්තොට සෆාරි උද්‍යානය			
1	ක්ෂීරපායි	33	401
2	පක්ෂි	37	169
3	උරග	01	344
	එකතුව	**71**	**914**
ගෝනපොල උද්‍යානය			
1	ක්ෂීරපායි	01	02
2	පක්ෂි	05	19
3	උරග (ඉබ්බන්)	01	113
	එකතුව	**07**	**134**
2022.12.31 දිනට මුළු සත්ත්ව විශේෂ සංඛ්‍යාව හා එකතුව		**234**	**3,729**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

1.5.5 **දෙපාර්තමේන්තුව විසින් සිදු කරන සත්ත්ව හුවමාරු වැඩසටහන් හා සතුන් මිලදී ගැනීම**

දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සහ සේවක පරිපාලනය මෙන්ම සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට සතුන් ලබාගැනීමේ ප්‍රධානතම මාර්ගය විදේශීය සත්වෝද්‍යාන සමඟ සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. මෙමඟින් දෙපාර්තමේන්තුවේ සත්ත්ව විශේෂ සංඛ්‍යාව ඉහළ නැංවීම, නව ජාන එකතු කිරීම තුළින් අභිජනන වැඩසටහන් විධිමත් කර නිරෝගී සත්ත්ව පරම්පරාවක් ඇති කිරීම අරමුණු කරනු ලබයි.

ලොව පුරා ව්‍යාප්තවූ කෝවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් ගුවන් ප්‍රවාහනයන් සීමා කිරීම මත සත්ත්ව හුවමාරු වැඩසටහන් සිදු කිරීම තාවකාලිකව නවතා දමන ලදී. ඒ අනුව, ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2022 වසරේදී ජාත්‍යන්තර වශයෙන් කිසිදු සත්ත්ව හුවමාරු වැඩසටහනක් සහ සතුන් මිලදී ගැනීම් කටයුත්තක් සිදු කර නොමැත.

1.6 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ආයතන හා එහි කාර්යයන්

1.6.1 දෙහිවල ජාතික සත්වෝද්‍යානය

අක්කර 23 ක භූමි භාගයක් පුරා පැතිරී ඇති දෙහිවල ජාතික සත්වෝද්‍යානය දේශීය හා විදේශීය ක්ෂීරපායී, පක්ෂි, උරග සහ මත්ස්‍ය විශේෂ රාශියකින් සමන්විතව අධ්‍යාපනික වටිනාකමකින් යුත් සත්ත්ව එකතුවක් පවත්වාගෙන යනු ලබයි. වර්තමානය වන විට සත්වෝද්‍යානයට නවීන සංකල්ප වලට ගැලපෙන පරිදි සත්ත්ව අරණවල් නවීකරණය කිරීමේ කටයුතු සිදු කරමින් පවතින අතර, සිංහ අරණ හා මුව අරණ අළුත්වැඩියා කිරීම මැකෝ ගිරවුන් සඳහා නව අරණක් ඉදිකිරීම ආදී කටයුතු සිදු කරමින් පවති.

වගු සටහන **1.10**
2022.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	58	258
2	පක්ෂි	69	831
3	උරග	35	163
4	මත්ස්‍ය සහ වෙනත් මුහුදු ජීවීන්	49	1101
5	උභය ජීවීන්	03	06
	එකතුව	**215**	**2359**

මූලාශ්‍රය : දෙහිවල සත්වෝද්‍යාන

වගු සටහන **1.11**
2022.12.31 දිනට දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	13	34
2	පක්ෂි	18	105
3	උරග	2	17
4	මත්ස්‍ය සහ වෙනත් මුහුදු ජීවීන්	4	150
	එකතුව	**37**	**306**

මූලාශ්‍රය : දෙහිවල සත්වෝද්‍යාන

වගු සටහන **1.12**
2022.12.31 දිනට දෙහිවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය

අරමුදල	**2022** වර්ෂය සඳහා ප්‍රතිපාදන(රු.මි)	**2022** සඳහා සත්‍ය වියදම(රු.මි)	මූල්‍ය ප්‍රගතිය %
රජයේ ඒකාබද්ධ අරමුදල	50	38.657	77
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	15	12.67	84
එකතුව	**65**	**51.327**	**79**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

වගු සටහන **1.13**
2022 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්

අනු අංකය	වැඩසටහන්	ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම	ක්‍රියාකාරකම් ප්‍රමාණය
01	අධ්‍යාපන දේශන හා ප්‍රායෝගික වැඩමුළු	පාසල්, වෛද්‍ය විද්‍යාල, භෙද විද්‍යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අධ්‍යාපනික වැඩසටහන් පැවැත්වීම.	11
		දේශීය වෛද්‍ය විද්‍යාල සිසුන් /භෙද නිලධාරීන් සඳහා සර්පයන් පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන්	03

		විශ්වවිද්‍යාල සිසුන් සඳහා දේශන පැවැත්වීම	02
		නරඹන්නන් සඳහා සතුන් පිළිබඳ විස්තර කථන වැඩසටහන්	243
		පාසල් සිසුන් සඳහා මාර්ගෝපදේශ සහිත සත්වෝද්‍යාන චාරිකා	13
		සත්ව වර්යා වැඩිදියුණු කිරීම පිළිබඳ ප්‍රායෝගික පුහුණු වැඩසටහන්	12
02	පර්යේෂණ	විශ්වවිද්‍යාල සිසුන් සඳහා ආයතනික පුහුණුව.	04
03	පුහුණු වැඩසටහන්/සේවක සුබසාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්	විශ්ව විද්‍යාල සිසුන් සඳහා ආයතනික පුහුණු වැඩසටහන්	14
04	විශේෂ වැඩසටහන්	සත්වෝද්‍යාන ප්‍රදර්ශන ඒකක පාසැල් හා ප්‍රදර්ශන සඳහා ලබා දීම	05
		විශේෂ උත්සව සැමරීම (අළුත් අවුරුදු,ළමා දිනය,සත්ව දිනය,උරග දිනය,සත්වෝද්‍යාන දිනය,ලෝක පරිසර දිනය,නත්තල් දිනයට සමගාමීව ප්‍රදර්ශනය)	

මූලාශ්‍රය : දෙහිවල ජාතික සත්වෝද්‍යානය

දෙහිවල සත්වෝද්‍යානයේ භෞතික ප්‍රගතිය

2022 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- මැකෝ ගිරවුන් සඳහා ඉදිකරන අරණ ඉදිකිරීම් 65%ක් දක්වා අවසන් කර ඇත (කොන්ත්‍රාත්කරු සමඟ ඇති ගිවිසුම අවසන් කිරීමට නියමිතය).
- සිංහ අරණ අළුත්වැඩියා කටයුතු 67%ක් දක්වා අවසන් කර ඇත (කොන්ත්‍රාත්කරු සමඟ ඇති ගිවිසුම අවසන් කරන ලදි).
- ගෝනපොළ ගොවිපොලෙහි ඉදිකරන සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානයෙහි ඉදිකිරීම් 85%ක් දක්වා අවසන් කර ඇත (කබල්ලෑවා, උණහපුළුවා, කොළ දිවියා යන සතුන් සංරක්ෂණය කිරීම සඳහා) කොන්ත්‍රාත්කරු සමඟ ඇති ගිවිසුම අවසන් කරන ලදි.

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- ඩීසල් ගබඩා කිරීමේ ටැංකිය ඉදිකිරීම් 90%ක් දක්වා අවසන් කර ඇත.
- සත්ත්ව ආහාර නිෂ්පාදනය සඳහා කහපොල ඉඩම සංවර්ධනය කිරීමේ කටයුතු 10%ක් පමණ සිදුකර ඇත.

රූපය 1.1 - සිංහ අරණ අළුත්වැඩියා කටයුතු



රූපය 1.2 - මැකෝ ගිරවුන් සඳහා අරණ



මූලාශ්‍රය : දෙහිවල ජාතික සත්වෝද්‍යානය

1.6.2 පින්නවල අලි අනාථාගාරය

වර්ෂ 1975.02.16 වැනි දින එවකට වරාය නාවික කටයුතු හා ගුවන් සේවා අමාත්‍යවරයාව සිටි දිවංගත පී.බී.ජී. කලුගල්ල මැතිතුමාගේ සංකල්පයක් අනුව වනජීවී දෙපාර්තමේන්තු මඟින් අක්කර විසි තුනක භූමියක් තුළ ඉදිකරන ලද කුඩා පොල් අතු මඩුවක "කුමාරි", "නිලා", "කදිරා", "විජය" සහ "මාතලී" යන කුඩා අලි පැටවුන් පස් දෙනෙකුගෙන් පින්නවල අලි අනාථාගාරය ආරම්භ කර තිබේ. පින්නවල අලි අනාථාගාරය වර්ෂ 1978 දී ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තු විෂය පථයට ඇතුළත් කර ඇති අතර මේ වන විට සිය ගමන් මගේ 47 වන සැතපුම් කණුව පසුකරමින් සිටියි.

අනාථ වූ අලි පැටවුන් රැක බලා ගැනීම මුඛ්‍ය අරමුණ ලෙස සලකමින් අලි අනාථාගාරය ආරම්භ කළ ද මේ වන විට ශ්‍රී ලංකා උප විශේෂයේ ආසියානු අලි ඇතුන් (*Elephas maximus maximus*) පරිබාහිර සංරක්ෂණය (Ex-situ conservation) හා අභිජනනය, සත්ත්ව සුඛසාධනය, අධ්‍යාපන හා පර්යේෂණ කාර්යය යන පුළුල් අරමුණු තෙක් මෙහි කාර්යභාරය පුළුල් වී තිබේ.

"විජය" නම් අලි පියාටත් "කුමාරි" නම් අලි මවටත් දාව "සුකුමලී" නම් අලි පැටවා 1984 වර්ෂයේ දී උපත ලබා තිබෙන අතර එය අලි අනාථාගාරයේ සිදු වූ පළමු අලි උපත ලෙස වාර්තා විය. 2022 වර්ෂය වන විට ස්වාභාවික අලි උපත් 71ක් සිදු වෙමින් ශ්‍රී ලංකාවේ සාර්ථක අලි අභිජනන මධ්‍යස්ථානය බවට අලි අනාථාගාරය පත්ව තිබේ.

වගු සටහන **1.14**
2022.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායී - ආසියානු අලියා	01	75
එකතුව		**01**	**75**

මූලාශ්‍රය : පින්නවල අලි අනාථාගාරය

වගු සටහන **1.15**
2022.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායී - ආසියානු අලියා	01	01
එකතුව		**01**	**01**

මූලාශ්‍රය : පින්නවල අලි අනාථාගාරය

වගු සටහන **1.16**
2022 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්

අනු අංකය	අධ්‍යාපනික වැඩසටහන් වර්ගය	ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම	ක්‍රියාකාරකම් ප්‍රමාණය
01	දේශන හා ප්‍රායෝගික වැඩමුළු	විශ්ව විද්‍යාල ව්‍යාපෘති සඳහා සිසුන් දැනුවත් කිරීම්.	02
		පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික වැඩසටහන්	2,334
		වීඩියෝ	05
02	පර්යේෂණ	i. Cabral de Mel, S. J., Seneweera, S., de Mel, R. K., Medawala, M., Abeysinghe, N., Dangolla, A., Weerakoon, D. K., Maraseni, T., & Allen, B. L. (2023). Virtual fencing of captive Asian elephants fitted with an aversive geofencing device to manage their movement. *Applied Animal Behaviour Science*, 258.	03

		https://doi.org/10.1016/j.applanim.2022.105822 Research period: May 2019 - May 2022 ii. Medawala, M. (2022). Analysis of past records on captive breeding of *Elephas maximus* at Pinnawala Elephant Orphanage (PEO), Sri Lanka. Gajah, 55. *40-44.* iii. Medawala, M., Gunawardana, B.H.S.M. and Ranawana, K.B. (2022) Analysis of past records on captive breeding of *Elephas maximus* at Pinnawala Elephant Orphanage (PEO), Sri Lanka, RESCON 2022.	
03	සේවක සුබසාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්	i. ඇස් පරීක්ෂාව ii. ක්ෂය රෝග පරීක්ෂාව iii. බෝ නොවන රෝග පරීක්ෂාව	03
04	විශේෂාංග සහ විශේෂිත දින සැමරුම්.	I. 2022.01.11 - හස්ති නාම මංගල්‍යය සුරංගිගේ නිවුන් අලි පැටවුන් දෙදෙනාට "දිසා" සහ "සජ්ජන" ලෙසත් රැජිනගේ අලුත උපන් අලි පැටවාට "නිලමනි" ලෙස නම් තැබීමේ උත්සවය. II. 2022.02.16 - කුංචනාදය • පින්නවල අලි අනාථාගාරයට වසර 47ක් සපිරීම නිමිත්තෙන් 2022.02.16 වන දින අලි ඇතුන් උදෙසා පෝෂණීය කිරිබත් සහ පළතුරු ලබා දානයක් දීම. • අලි අනාථාගාරයේ කාර්ය මණ්ඩලයේ දුදරුවන් විසින් "සුරකිමු අලි පරපුර" යන තේමාව යටතේ අඳින ලද සිතුවම් සඳහා සහතික ලබා දීම. • පිපල්ස් ලීසිං සමාගමේ අනුග්‍රහයෙන් පින්නවල අලි අනාථාගාරය පරිශ්‍රය තුල අධ්‍යාපනික දැනුවත් කිරීමේ පුවරුවක් ප්‍රදර්ශනය කිරීම. • පශු වෛද්‍ය අංශය විසින් අලි ඇතුන්ගේ ප්‍රජනන පද්ධතිය ආශ්‍රිත දැනුවත් කිරීමේ පුවරුවක් ප්‍රදර්ශනය කිරීම. III. 2022.04.17 - හිස තෙල් ගෑමේ උත්සවය පින්නවල අලි අනාථාගාරයේ සුවිශේෂී සංස්කෘතික උළෙලක් ලෙස වාර්ෂිකව සමරනු ලබන අලි ඇතුන්ගේ හිසතෙල් ගෑමේ මහෝත්සවය අප්‍රේල් 17 වන දින පූර්ව භාග 07.04 ට යෙදුණු සුබ මොහොතින් ඉතාමත් වාම ආකාරයෙන් පින්නවල අලි අනාථාගාර භූමි පරිශ්‍රයේ දී පැවැත්විණි. IV. 2022.06.05 - ලෝක පරිසර දිනය • ඌන භාවිත පළතුරු පැල රෝපණය. • පරිහරණයෙන් පසු ඉවත ලන බොල්පොයින්ට් පෑන් එක් රැස් කර පරිසර අමාත්‍යාංශයේ "නීතියක් නොවේ විනයක්" යන ව්‍යාපෘතියට භාර දීම ආරම්භ කිරීම. V. 2022.06.14 - පොසොන් පෝය දින දන්සල පොසොන් පූර පසලොස්වක පොහෝ දිනය (14) නිමිති කරගෙන පින්නවල අලි අනාථාගාරයේ කාර්ය මණ්ඩලය විසින් පින්නවල අලි අනාථාගාරය නැරඹීමට පැමිණෙන නරඹන්නන් හා මහජනතාව වෙනුවෙන් දන්සැලක් පවත්වන ලදි. VI. 2022.07.14 - බාලදක්ෂ වැඩසටහන කෑගල්ල දිස්ත්‍රික් බාලදක්ෂ සංගමයට අයත් "මා ඔය දියවර" විවෘත පෝතක බාලදක්ෂ කණ්ඩායමේ පදක්කම් ප්‍රදානය අලි අනාථාගාර පරිශ්‍රයේ සිදු කෙරිණි. VII. 2022.08.12 - ලෝක අලි දිනය • අලි ඇතුන් උදෙසා සෙත් පිරිත් සජ්ජායනය කිරීම. • අලි ඇතුන් සඳහා පෝෂණීය කිරිබත් හා පලතුරු දානයක් ලබා දීම. VIII. 2022.08.31 - නිවුන් අලි පැටවුන්ගේ උපන් දින සැමරුම හා "අමාලිගේ" පැටවාට නම් තැබීම • සුරංගිගේ නිවුන් අලි පැටවුන්ගේ පළමු උපන් දින සැමරුම. • අමාලිගේ අලි පැටියාට "ධරණි" ලෙස නම් තැබීම. • තරුණ සත්වවේදීන්ගේ සංගමයේ පින්නවල ශාඛාව පිහිටවීම.	

		IX. 2022.12.27 පිරිත් පිංකම පින්නවල අලි අනාථාගාරයේ මිය ගිය අලි ඇතුන්ට හා සේවකයන් වෙනුවෙන් ධර්ම දේශනාවක් පවත්වා සර්ව රාත්‍රික පිරිත් පිංකමක් සිදු කිරීම.
04	පුහුණු වැඩසටහන්	කාර්යමණ්ඩල සඳහා දෙමළ භාෂා පුහුණු වැඩසටහන. කාර්යමණ්ඩලය සඳහා චීන රජය මඟින් ලබා දුන් පුහුණු වැඩ සටහන.

මූලාශ්‍රය : පින්නවල අලි අනාථාගාරය

වගු සටහන 1.17
2022.12.31 දිනට පින්නවල අලි අනාථාගාරයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය

අරමුදල	2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මි)	2022 සඳහා සත්‍ය වියදම (රු.මි)	මූල්‍ය ප්‍රගතිය %
රජයේ ඒකාබද්ධ අරමුදල	40	38.58	96
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	20	0.43	2
එකතුව	**60**	**39.01**	**65**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

පින්නවල අලි අනාථාගාරයේ භෞතික ප්‍රගතිය

2022 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

රජයේ ඒකාබද්ධ අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘති

- විදුලි බලය බෙදාහැරීමේ පද්ධතියේ අලුත්වැඩියා කටයුතු සම්පූර්ණ කර ඇත.
- නව අලිමඩු ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත.
- දේශීය හා විදේශීය නරඹන්නන් සඳහා වූ වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් 85% ක් දක්වා නිමකර ඇත.
- හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි ගේට්ටුව සහ වැටෙහි ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත.
- ප්‍රවේශ ගොඩනැගිල්ලේ වහළ අළුත්වැඩියා කටයුතු සම්පූර්ණ කර ඇත.

සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- සත්ව ආහාර නිෂ්පාදනය සඳහා දියගම ඉඩම සංවර්ධනය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

රූපය 1.3 - නව අලිමඩු ඉදිකිරීම්



රූපය 1.4 - හදිසි අවස්ථාවකදී භාවිතා කළ හැකි ගේට්ටුව සහ වැට



රූපය 1.5 - විදුලි බලය බෙදාහැරීමේ පද්ධතියේ අලුත්වැඩියා කටයුතු





1.6.3 පින්නවල සත්වෝද්‍යානය

සබරගමුව පළාතේ, කෑගලු දිස්ත්‍රික්කයේ රඹුක්කන - කෑගල්ල මාර්ගයේ සුන්දර මා ඔය නදියට සමීපව එහි දකුණු ඉවුරේ, පින්නවල අලි අනාථාගාරය පෙනෙන මානයේ මනස්කාන්ත භූදර්ශනයක් සහිත චමත්කාර ජනක පරිසරයක ශ්‍රී ලංකාවේ ප්‍රථම එලිමහන් සත්වෝද්‍යානය ලෙස පින්නවල සත්වෝද්‍යානය නිර්මාණය කර ඇත.

අක්කර 36 ක් පුරා පැතිර ඇති සත්වෝද්‍යානය 2015 අප්‍රේල් මස 17 වන දින දෙස් විදෙස් සංචාරකයින් සඳහා විවෘත කරන ලදී. සංචාරකයින් සනහාලන විනෝද පාරාදීසයක් ලෙසත්, පාසල් සිසු දරුවන්ගේ දැනුම් පිපාසය නිවාලන සජීවී පංතිකාමරයක් ලෙසත්, විශ්වවිද්‍යාලවල ඉගෙනුම ලබන විද්‍යාර්ථයින්, ආචාර්ය මණ්ඩලය හා පර්යේෂකයින් සඳහා ක්‍රියාකාරී සජීවී පර්යේෂණ මධ්‍යස්ථානයක් මෙන්ම නිදහස් ගවේෂකයින් හා සත්ත්වවේදීන් වෙනුවෙන් සේවා සැපයුම් මධ්‍යස්ථානයක් ලෙසත් ක්‍රියාත්මක පින්නවල සත්වෝද්‍යානය සතුන්ගේ ස්වභාවික චරියාවන් හා පාරිසරික තත්වයන්ට ආසන්න ලෙස නිමවන ලද සත්ව අරණ වලින් සමන්විත වේ.

සුරතල් සත්ව අරණ හාවන්, තාරවන්, පාත්තයන්, ඉබ්බන්, චීන පාත්තයින් කළු සහ සුදු හංසයින්ගෙන් සමන්විත වන අතර, ලංකාව තුළ ජීවත් වන මුව වර්ගවලින් මුව අරණ සමන්විතවේ. ඔරෙක්ස් ගව අරණ, පෝනින් සහ බූරුවන්ගේ අරණ පින්නවල සත්වෝද්‍යානයට නැවුම් වූ අත්දැකීමක් එක් කරන අතර රජ සියක්කාරයින් සඳහා වෙන් වූ සියක්කාර අරණ සහ ලංකාවේ වෙසෙන හැල කිඹුලන් සහ ගැට කිඹුලන්ගෙන් කිඹුල් අරණ සමන්විත වේ.

ශ්‍රී ලංකාවට ආවේණික, කොටින්ගේ උප විශේෂයක් වන ශ්‍රීලංකාවේ දිවියන් සඳහා (ඔවුන්ට ආවේණික වූ සුවිශේෂී චාර්යාවන් වඩාත් ආසන්නයටම ගොස් නැරඹීමට හැකි වන ලෙස) වූ දිවි අරණත් දිවි අරණට යාබදව 2022 වසරේදී සත්වෝද්‍යානය වෙත අලුතින් හඳුන්වා දුන් රාජකීය බෙංගාලි ව්‍යාඝ්‍රයින් සඳහා වෙන් වූ බෙංගාලි ව්‍යාඝ්‍ර අරණත් ඉදිකර ඇත. ශ්‍රී ලංකාවේ වලසුන් සඳහා වූ වලස් අරණත්, ශාක භක්ෂක සතුන් සඳහා වන නිදහස් වන අරණ සහ විවෘත සමනල උයන ආදී වූ සත්ව අරණ මේ වන විට නරඹන්නන් අතර ජනප්‍රියතාවයට පත්ව ඇත.

සත්වෝද්‍යානයේ මිය යන සත්ව විශේෂ සංරක්ෂණය කරමින් නරඹන්නන් සඳහා දැනුම ලබාදීම පිණිස පින්නවල සත්වෝද්‍යානයේ කෞතුකාගාරය 2022 වර්ෂයේ සිට නරඹන්නන් වෙනුවෙන් විවෘත කර ඇත. තවද, නරඹන්න් සඳහා සතුන් සමඟ සමීපවීමට අවස්ථාව ලබාදීම හා ඒ තුළින් නව ආදායම් උත්පාදන ක්‍රමවේද ඇති කිරීම අරමුණු කර ගනිමින් 2022 වර්ෂයේ අග භාගයේදී, වයස අවුරුදු 12ට අඩු දරුවන් සඳහා පෝනියා පිට ගමන් කිරීම, ශාක භක්ෂක සතුන් සඳහා ආහාර ලබාදීම, සර්පයින් සමඟ ඡායාරූප ගැනීමට අවස්ථාවක් ලබාදීම, කිඹුලන් හා මාංශ භක්ෂක සතුන් සඳහා ආහාර ලබාදීමේ වැඩසටහන් ආරම්භ කරන ලදී.

වගු සටහන 1.18 2022.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව එකතුව			
සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	18	192
2	පක්ෂි	08	48
3	උරග	05	11
	එකතුව	**31**	**251**

වගු සටහන 1.19 2022.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව			
සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	8	44
	එකතුව	**8**	**44**

වගු සටහන 1.20 2022 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්			
අනු අංකය	**වැඩසටහන්**	**ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම**	**ක්‍රියාකාරකම් ප්‍රමාණය**
01	අධ්‍යාපන දේශන හා ප්‍රායෝගික වැඩමුළු	ලෝක ළමා හා වැඩිහිටි දිනය - අවුරුදු 12 ට අඩු ළමයින් සහ අවුරුදු 60 වැඩි වැඩිහිටියන්	01
		වාර්තාමය වැඩසටහ ස්වර්ණවාහිනිය - ග්‍රාහකයින්	01
		රඹුක්කන පරාක්‍රම විද්‍යාලයේ ශිෂ්‍ය නායක වැඩමුළුව- ශිෂ්‍ය නායකයින්	01
		ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ වාර්තා වැඩසහන - විශ්වවිද්‍යාල විද්‍යාර්ථයින්	01
		පරිසර අධ්‍යාපන වැඩසටහන - බැමිණිවත්ත විද්‍යාලයේ බාලදක්ෂ කණ්ඩායම	01
		ඡායාරූප වැඩමුළුව - ඡායාරූප කරණය හදාරණ සිසුන්	01
		බාහිර අධ්‍යාපන ප්‍රදර්ශන යක්කල අනුර මධ්‍ය මහා විද්‍යාලයේ පැවැති අධ්‍යාපන ප්‍රදර්ශනය දෙහිවල සත්වෝද්‍යානයේ පැවැති සතුන් අපේ මිතුරෝ තේමාව කරගත් අධ්‍යාපන ප්‍රර්ශනය	01
02	පර්යේෂණ	කොළඹ විශ්වවිද්‍යාලයේ කළමනාකරණ පීඨය සහ පශ්චාත් උපාධි අධ්‍යාපන පීඨයේ සිසුන් හා ආචාර්ය මණ්ඩලය.	01
03	පුහුණු වැඩසටහන්/සේවක සුබසාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්	සතුන් සම්බන්ධ කථන වැඩසටහන - පින්නවල සත්වෝද්‍යානයේ සත්ව අංශයේ සේවකයින්	01
04	විශේෂ වැඩසටහන්	පාසල් ශිෂ්‍ය, ශිෂ්‍යාවන් අරමුණු කරගනිමින් සිදුකරන ලද සතුන් සම්බන්ධ කථන වැඩටහන්	04

වගු සටහන 1.21 2022.12.31 දිනට පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය			
අරමුදල	**2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මී)**	**2022 සඳහා සත්‍ය වියදම (රු.මී)**	**මූල්‍ය ප්‍රගතිය %**
රජයේ ඒකාබද්ධ අරමුදල	40	27.46	69
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	1	1	100
එකතුව	**41**	**28.46**	**69**

පින්නවල සත්වෝද්‍යානයේ භෞතික ප්‍රගතිය

2022 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- අභ්‍යන්තර මාර්ග පද්ධතිය සහ වැසි වතුර බැස යාමේ පද්ධතියේ සහ අභ්‍යන්තර විදුලිය බෙදාහැරීමේ පද්ධතියේ ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත.
- කබල්ලෑවා සඳහා වූ අරණෙහි ඉදිකිරීම් සම්පූර්ණ කර ඇත.
- මෝදරවත්ත රථගාල ඉදිකිරීම් කටයුතු 65%ක් අවසන් කර ඇත. කොන්ත්‍රාත්කරු සමඟ ඇති ගිවිසුම අවසන් කිරීමට නියමිතය.

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- ප්‍රවේශ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු (water proofing work) 90% අවසන් කර ඇත. කොන්ත්‍රාත්කරු සමඟ ඇති ගිවිසුම අවසන් කර ඇත.

රූපය 1.6 - විදුලි බලය බෙදාහැරීමේ පද්ධතිය අලුත්වැඩියා කටයුතු සහ වැසි වතුර බැස යාමේ පද්ධතිය, අභ්‍යන්තර විදුලිය බෙදාහැරීමේ පද්ධතිය.



රූපය 1.7 - කබල්ලෑවා සඳහා වූ අරණ



මූලාශ්‍රය : පින්නවල සත්වෝද්‍යානය

1.6.4 රිදියගම සෆාරි උද්‍යානය

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවට අනුබද්ධිත සෆාරි උද්‍යානය අම්බලන්තොට ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ පිහිටා ඇත. නව සත්වෝද්‍යාන සංකල්පයක් මත අක්කර අක්කර 500 ක වපසරියකින් පිහිටි මෙම ආයතනයේ පළමු අදියර 2016 මාර්තු 18 දින මහජනතාවට විවෘත කරන ලදි. පළමු අදියර යටතේ අප්‍රිකානු සිංහ කලාපය, ශාක භක්ෂක කලාපය, ආසියානු අලි කලාපය යන කලාපය 03 මහජන ප්‍රදර්ශනය සඳහා විවෘත විය.

දෙවන අදියර යටතේ 2019 වසරේදී බෙංගාල ව්‍යාඝ්‍ර කලාපය සංචාරකයින් සඳහා විවෘත කළ අතර 2022 වර්ෂයේදී කුඩා සත්ත්ව රාජධානිය හා සමනල් උයන විවෘත කරන ලදි. කුඩා සත්ව රාජධානියේ සතුන් සුරතල් කිරීම, අලීන්ට කෑම කැවීම, පක්ෂීන්ට කෑම කැවීම, මත්ස්‍ය සම්බාහන ඒකකය යන ක්‍රියාකාරකම් ආරම්භ කරන ලදි.

වගු සටහන 1.22
2022.12.31 දිනට රිදියගම සෆාරි උද්‍යානයේ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	33	401
2	පක්ෂි	37	169
3	උරග	01	344
එකතුව		**71**	**914**

වගු සටහන 1.23 2022.12.31 දිනට රිදියගම සෆාරි උද්‍යානයේ සත්ත්ව අභිජනන සංඛ්‍යාව			
සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	12	29
2	පක්ෂි	3	6
	එකතුව	**15**	**35**

මූලාශ්‍රය : හම්බන්තොට සෆාරි උද්‍යානය

වගු සටහන 1.24 2022.12.31 දිනට රිදියගම සත්වෝද්‍යානයේ සංවර්ධන ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය			
අරමුදල	**2022 වර්ෂය සඳහා ප්‍රතිපාදන (රු.මී)**	**2022 සඳහා සත්‍ය වියදම (රු.මී)**	**මූල්‍ය ප්‍රගතිය %**
රජයේ ඒකාබද්ධ අරමුදල	40	35	88
සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල	25	2.42	10
එකතුව	**65**	**37.42**	**57.57**

වගු සටහන 1.25 2022 වර්ෂයේ සිදු කරන ලද අධ්‍යාපනික, පර්යේෂණ, පුහුණු සහ විශේෂ වැඩසටහන්			
අනු අංකය	**අධ්‍යාපනික වැඩසටහන් වර්ගය**	**ක්‍රියාකාරකම/ ඉලක්කගත කණ්ඩායම**	**ක්‍රියාකාරකම් ප්‍රමාණය**
01	අධ්‍යාපන, දේශන හා ප්‍රායෝගික වැඩමුළු	නමඩගස්වැව විද්‍යාලයේ උරගයන් පිළිබඳ දැනුවත් කිරීමේ අධ්‍යාපන වැඩසටහන.	01
02	පුහුණු වැඩසටහන්/ සේවක සුභසාධනය උදෙසා පවත්වන ලද වැඩසටහන්	බිලාල කුලයේ විශාල සතුන් හැසිරවීම පිළිබඳ පුහුණු වැඩසටහන	01
03	විශේෂාංග සහ විශේෂ දින සැමරුම්	• සෙත් පිරිත් දේශනාව හා රුක් රෝපණ වැඩසටහන. • ෂැංග්‍රිලා හෝටල් සමූහයේ ශ්‍රම දායකත්වයෙන් සිදු කරන ලද සමනල උයනෙහි ශ්‍රමදාන වැඩසටහන. • සමනල දිනයට සමගාමීව පවත්වන ලද සමනල උයනෙහි පවත්වන ලද රුක් රෝපණ හා ශ්‍රමදාන වැඩසටහන • කුඩා සත්ව කලාපය, සමනල උයන සහ සත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය මහජන ප්‍රදර්ශණයට යොමු කිරීම. • තරුණ සත්වවේදීන්ගේ සංගමයෙහි රිදියගම ශාඛාව ආරම්භ කිරීම • ස්වේච්ඡා සේවක වැඩසටහන් ආරම්භ කිරීම. • නත්තල් සමයට සමගාමීව දෙහිවල සත්වෝද්‍යානයේ ප්‍රදර්ශන කුටියක් පවැත්වීම	

මූලාශ්‍රය : රිදියගම සෆාරි උද්‍යානය

රිදියගම සෆාරි උද්‍යානය භෞතික ප්‍රගතිය

2022 වර්ෂයේ සිදු කරනු ලැබූ ප්‍රධාන සංවර්ධන කාර්යයන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

රජයේ ඒකාබද්ධ අරමුදල මගින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- **කුඩා සෆාරි උද්‍යානයේ**
  - විදේශීය කුරුළු උයන ඉදිකිරීම් 75%ක් වැඩ අවසන් කර ඇත. කොන්ත්‍රාත්කරු සමඟ ඇති ගිවිසුම අවසන් කරන ලදි.

- **චීටා කලාපය**
  - චීටා සඳහා ගුහා හා රැඳවුම් පෙදෙස 40%ක් වැඩ අවසන් කර ඇත. කොන්ත්‍රාත්කරු සමඟ ඇති ගිවිසුම අවසන් කරන ලදි.
  - ආසියානු අලි කලාපය සහ චීටා කලාපය අතර අඩි 16 උස චේන් ලින්ක් වැට 78%ක් වැඩ අවසන් කර ඇත. තාවකාලිකව වැඩ නතර කර ඇත.
- **ආසියානු කලාපය**
  - රුක් නිවාස (Tree Huts) 35%ක් වැඩ අවසන් කර ඇත. ව්‍යාපෘතිය කල්දමා ඇත.
  - බොරළු පාර - ආසියානු අලි කලාපය 50%ක් වැඩ අවසන් කර ඇත. ව්‍යාපෘතිය කල්දමා ඇත.

සත්වෝද්‍යාන සංවර්ධන හා සුබසාධන අරමුදල මඟින් ක්‍රියාත්මක ව්‍යාපෘතීන්

- අංක 03 - සිංහ ගුහාව 89%ක් වැඩ අවසන් කර ඇත. තාවකාලිකව වැඩ නතර කර ඇත.

රූපය 1.8 - ආසියානු අලි කලාපය සහ චීටා කලාපය අතර අඩි 16 උස චේන් ලින්ක් වැට



රූපය 1.9 - සිංහ ගුහාව



මූලාශ්‍රය : රිදියගම සෆාරි උද්‍යානය

1.6.5 ගෝනපොල සත්වෝද්‍යාන ගොවිපළ

දෙහිවල ජාතික සත්වෝද්‍යානයේ ශාකභක්ෂක සතුන් සඳහා අවශ්‍ය නැවුම් සහ පෝෂණ ගුණයෙන් යුතු ආහාරවලින් කොටසක් සැපයීම පිණිස මෙම ගොවිපළ 1997 වර්ෂයේ දී හොරණ - ගෝනපොල ප්‍රදේශයේ අක්කර 16 ක භූමියක් තුළ ස්ථාපිත කරන ලදී. මේ වන විට හම්බන්තොට සෆාරි උද්‍යානය, පින්නවල අලි අනාථාගාරය වෙතද අවශ්‍යතාවය මත තණකොළ හා තැඹිලි වැනි ද්‍රව්‍ය සැපයීම සිදුකරනු ලබයි.

2022 වර්ෂය තුළ දෙහිවල සත්වෝද්‍යානය වෙත සපයන ලද සත්ත්ව ආහාර ප්‍රමාණය (Co4 තණකොළ), අතිරික්ත සතුන් හා අතිරික්ත බෝග (තැඹිලි හා උක්දඬු) අලෙවි කිරීමෙන් ලද ආදායම ඇතුළුව, 2022 වසර තුළ රු.මි. 10.24 ක පමණ සමස්ත ආදායමක් ලබා ඇත. ගෝනපොල ගොවිපළ සත්වෝද්‍යාන අරමුණු සඳහා වඩාත් ඵලදායී ලෙස දායක කර ගනිමින් ගෝනපොල ගොවිපළ පරිශ්‍රය තුළ දෙහිවල සත්වෝද්‍යානයේ සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය ඉදිකිරීමට කටයුතු කර ඇත.

වගු සටහන 1.26
2022.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව එකතුව

සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	ක්ෂීරපායි	01	02
2	පක්ෂි	05	19
3	උරග	01	113
	එකතුව	**07**	**134**

වගු සටහන 1.27 2022.12.31 දිනට ගෝනපොළ සත්වෝද්‍යාන ගොවිපළ සත්ත්ව අභිජනන සංඛ්‍යාව			
සත්ත්ව වර්ගීකරණය		විශේෂ/පවුල්	සත්ත්වයින් ප්‍රමාණය
1	පක්ෂි	2	4
	එකතුව	2	4

1.7 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

1.7.1 රජයේ ඒකාබද්ධ අරමුදල

2022 වර්ෂය අවසන් වන විට රජයේ ඒකාබද්ධ අරමුදලින් දරණ ලද වියදම රු. 691,408,000ක් වන අතර ප්‍රාග්ධන වියදම රු. 145,908,696ක් සහ පුනරාවර්තන වියදම ලෙස රු. 545,499,304ක් ලෙස උපයෝජනය කොට ඇත.

වගු සටහන 1.28 : වියදම් තොරතුරු - රජයේ ඒකාබද්ධ අරමුදල

වියදම් තොරතුරු - රජයේ ඒකාබද්ධ අරමුදල

(රු.000)

ඛාය අංකය	වර්ගීකරණය / වැය ශීර්ෂය	2021		2022	
		සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම	සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම
	පුනරාවර්තන වියදම	**566,000**	**526,345**	**569,000**	**545,499**
	පුද්ගල වේතන	**479,000**	**443,190**	**488,000**	**472,649**
1001	වැටුප් සහ වේතන	280,000	259,969	260,000	253,160
1002	අතිකාල හා නිවාඩු දින ගෙවීම්	95,000	90,413	90,000	88,146
1003	වෙනත් දීමනා	104,000	92,808	138,000	131,343
	ගමන් වියදම්	**2,200**	**1,879**	**2,600**	**1,879**
1101	දේශීය	2,200	1,879	2,500	1,879
1102	විදේශීය	0	0	100	0
	සැපයුම්	**22,500**	**22,084**	**22,500**	**21,816**
1201	ලිපි ද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා	3,000	2,807	2,500	2,034
1202	ඉන්ධන	14,000	13,924	15,000	14,784
1203	ආහාර සහ නිල ඇඳුම්	5,500	5,352	5,000	4,997
	නඩත්තු වියදම්	**12,600**	**11,839**	**10,900**	**10,778**
1301	වාහන	8,000	7,381	7,000	6,998
1302	යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	1,000	987	1,500	1,387
1303	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	3,600	3,470	2,400	2,393
	සේවා	**47,200**	**45,236**	**42,500**	**36,436**
1402	තැපැල් සහ සන්නිවේදන	3,000	2,687	3,000	2,700
1403	විදුලිය සහ ජලය	28,100	27,516	25,000	22,620
1404	කුලී සහ දේශීය බදු	2,000	1,048	1,500	936
1409	වෙනත්	14,100	13,985	13,000	10,180
	පැවරුම්	**2,500**	**2,115**	**2,500**	**1,940**
1506	දේපළ ණය පොළිය	2,500	2,115	2,500	1,940
	ප්‍රාග්ධන වියදම්	**720,800**	**293,798**	**180,000**	**145,908**
	ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියාව සහ වැඩිදියුණු කිරීම	**7,800**	**7,185**	**7,000**	**4,450**
2002	යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	2,800	2,267	2,000	418
2003	වාහන	5,000	4,917	5,000	4,032
	ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	**80,000**	**11,844**	**2,500**	**1,599**
2101	වාහන	50,000	0	0	0
2102	ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ	5,000	2,715	500	114
2103	යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	25,000	9,129	2,000	1,486
	මානව සම්පත් සංවර්ධනය	**1,000**	**478**	**500**	**160**
2401	කාර්ය මණ්ඩල පුහුණුව	**1,000**	**478**	500	160

අංශ්‍ය කේතය	වර්ගීකරණය / වැය ශීර්ෂය	2021		2022	
		සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම	සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම
	දෙහිවල සත්වෝද්‍යානය සංවර්ධනය (1)	**240,000**	**86,179**	**50,000**	**38,657**
2001	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	170,000	54,802	20,000	15,796
2104	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	70,000	31,377	30,000	22,861
	පින්නවල අලි අනාථාගාරය සංවර්ධනය (2)	**130,000**	**62,611**	**40,000**	**38,580**
2103	යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	10,000	0	2,000	1,716
2104	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	120,000	62,611	38,000	36,864
	පින්නවල සත්වෝද්‍යානය සංවර්ධනය (3)	**150,000**	**30,099**	**40,000**	**27,463**
2103	යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	10,000	0	2,000	920
2104	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	140,000	30,099	38,000	26,543
	හම්බන්තොට සඟරි උද්‍යානය සංවර්ධනය (4)	**112,000**	**95,402**	**40,000**	**35,000**
2104	ගොඩනැගිලි සහ ඉදිකිරීම්	80,000	73,394	35,000	35,000
2105	ඉඩම් සහ ඉඩම් සංවර්ධනය	7,000	0	2,000	0
2506	යටිතල පහසුකම් සංවර්ධනය	25,000	22,008	3,000	0
	අයවැය යෝජනා	**-**	**-**	**-**	**-**
2506	යටිතල පහසුකම් සංවර්ධනය - විවෘත අරණ (5)	-	-	-	-
2506	යටිතල පහසුකම් සංවර්ධනය - පින්නවල (6)	-	-	-	-
	මුළු වියදම	**1,286,800**	**820,143**	**749,000**	**691,408**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

1.7.2 සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල

1982 අංක 41 දරණ ජාතික සත්ත්ව උද්‍යාන පනතේ විධිවිධාන වලට අනුව සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල පිහිටුවා ඇත. ප්‍රවේශ පත්‍ර ආදායම්, සත්වෝද්‍යාන නිෂ්පාදන විකිණීමෙන් ලැබෙන සියලු මුදල්, පරිත්‍යාග, දඩ මුදල් හෝ ආදායමක් වශයෙන් කවර ප්‍රභවයකින් හෝ ලැබූ මුදල් මෙම අරමුදලට බැර කරනු ලැබේ.

2022 වර්ෂය තුළ සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදලේ වියදම රු. 737,092,379 ක් වේ. එය ප්‍රාග්ධන වියදම ලෙස රු. 24,207,022 ක් සහ පුනරාවර්තන වියදම ලෙස රු. 712,885,356 ක් ලෙස උපයෝජනය කොට ඇත.

වගු සටහන 1.29 - වියදම් තොරතුරු - සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල.

වියදම් තොරතුරු - සත්වෝද්‍යාන සංවර්ධන සහ සුබ සාධක අරමුදල.

(රු.000)

වැය අංකය	වර්ගීකරණය / වැය ශීර්ෂය	2021		2022	
		සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම	සංශෝධිත ඇස්තමේන්තුව	සත්‍ය වියදම
	පුනරාවර්තන වියදම				
Re.01	සත්ත්ව ආහාර	494,000	372,762	624,000	518,287
Re.02	ප්‍රවේශ පත්‍ර මුද්‍රණය	3,000	665	2,000	1,966
Re.03	දිරි දීමනා ගෙවීම	50,000	38,114	51,000	50,524
Re.04	පාරිභෝජන සේවා	20,000	12,887	19,350	18,084
Re.05	වෛද්‍ය සැපයීම්	11,000	10,259	5,000	4,731
Re.06	බදු ගෙවීම	2,000	-	3,000	2,575
Re.08	අලෙවි ප්‍රවර්ධනය සහ ප්‍රචාරණය	1,000	12	500	-
Re.09	විවිධ වියදම්	50,000	34,475	66,600	66,567
Re.10	විදේශීය පුහුණු වීම්	-	-	500	389
Re.11	දේශීය පුහුණු වීම්	500	67	500	95
Re.12	වාහන නඩත්තුව	8,000	4,195	8,700	8,666
Re.13	අධ්‍යාපනය සහ පර්යේෂණ	25	-	1,025	240
Re.14	සේවක සුබසාධනය	1,000	572	500	250
Re.15	සත්ත්ව හුවමාරු වැඩසටහන සහ සත්ත්ව අභිජනනය	-	-	-	-
Re.16	සෆාරි උද්‍යානයේ ප්‍රවාහන වියදම්	15,000	12,645	20,000	16,249
Re.17	ප්‍රධාන කාර්යාලය සඳහා කුළී ගාස්තු	-	-	-	-
Re.18	මෙහෙයුම් කටයුතු සඳහා ඉන්ධන වියදම්	6,000	5,082	24,350	24,261
	මුළු පුනරාවර්තන වියදම	661,525	491,737	827,025	712,885
	ප්‍රාග්ධන වියදම				
C.25	දෙහිවල සත්වෝද්‍යානයේ නව ඉදිකිරීම්	15,000	4,198	15,000	12,670
C.26	රිදියගම සෆාරි උද්‍යානය	25,000	7,151	25,000	2,418
C.27	පින්නවල නව සත්වෝද්‍යානය	14,000	3,587	1,000	1,000
C.28	අලි අනාථාගාරය	20,000	-	20,000	425
C.29	නව ඉදිකිරීම් සඳහා උපකරණ අත්පත් කර ගැනීම	10,000	1,380	10,000	4,468
C.31	වෛද්‍ය උපකරණ මිල දී ගැනීම	4,000	-	5,000	3,226
C.32	සතුන් මිල දී ගැනීම	10	-	10,000	-
C.33	**සතුන් මිල දී ගැනීමට අදාළ වියදම්**	10	-	10,000	-
	මුළු ප්‍රාග්ධන වියදම	**88,020**	**16,316**	**76,020**	**24,207**
	මුළු වියදම	**749,545**	**508,053**	**903,045**	**737,092**

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

02. පරිච්ඡේදය
ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 ජයග්‍රහණ

- 2022 වසරට අදාළව විශේෂ ජයග්‍රහණ කිසිවක් වාර්තා වී නොමැත.

2.2 අභියෝග

- කොවිඩ් වසංගත තත්ත්වය නිසා පහත වැටී ඇති ආදායම ඉහළ නංවා ගැනීම.
- රටේ පවතින උද්ධමනකාරී තත්ත්වය නිසා සත්ත්ව ආහාර, ඉන්ධන වියදම සහ වෙනත් නඩත්තු කටයුතු සඳහා යන වියදම අධික වීම.
- වැය වන වියදමට සාපේක්ෂව ලැබෙන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම.
- වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත්කර තිබූ සංවර්ධන ව්‍යාපෘති ගණනාවක් ප්‍රතිපාදන නොමැතිකමින් කල් දැමීමට ට සිදුවීම.
- පවතින උද්ධමනකාරී තත්ත්වය නිසා කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම් ගතවී තිබූ ව්‍යාපෘති කිහිපයක් දෙපාර්ශවය එකඟත්වයෙන් අවසන් කිරීමට සිදුවීම.
- පවතින කොවිඩ් වසංගත ත්ත්වය හේතුවෙන් රටවල් අතර සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම අපහසුවීම හා එමඟින් නව අභිජනනයන් සිදු කිරීමට බාධා ඇති වීම.
- විටින් විට වෙනස්වන සත්ත්ව සුභසාධන ප්‍රතිපත්ති වල නොගැලපීම් ඇතිවීම.
- සතුන් රඳවා තබාගැනීමට එරෙහිව විවිධ පාර්ශවයන් තුළින් එල්ල වන බලපෑම ප්‍රවණතාවය ඉහළයාම.
- අන්තර් ජාතික ප්‍රචාරණය ඉහළ නංවා ගැනීම.
- සාමූහිකව වැඩ කිරීමේදී කාර්ය මණ්ඩලයේ සැමදෙනාගේම දායකත්වය එක හා සමාන නොවීමත් නව්‍යකරණයන් කෙරෙහි එකවර නැඹුරුවීමට මැලිකමක් දැක්වීම.
- තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව කාර්ය මණ්ඩලයේ බොහෝ දෙනෙකු දැනුවත් නොවීම.
- ඉලක්ක රාශියක් පැවතුනත් එම ඉලක්ක සපුරා ගැනීම සඳහා සම්පත් හිඟකම

2.3 ඉදිරි ඉලක්ක

- ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම.
- දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ඒකක වල සිදුකරන සංවර්ධන කටයුතු සම්පූර්ණ කිරීම.
- පුහුණු වැඩසටහන් සහ වෘත්තීය නිපුණතා ප්‍රමිතීන් ස්ථාපිත කිරීම.
- ඝන අපද්‍රව්‍ය කළමණාකරණ ක්‍රම හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම.
- මාර්ගගත ප්‍රවේශපත්‍ර ක්‍රමයක් ස්ථාපිත කිරීම.
- නරඹන්නන් සඳහා ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- තාක්ෂණික දැනුම ඇති කාර්යමණ්ඩලයක් බඳවා ගැනීම.
- අන්තර්ජාතික තත්ත්ව ප්‍රමිති සහතිකය ලබා ගැනීම.
- වෘත්තීය පුහුණු නිපුනතා මට්ටම් 5 සහ 6 පිළිබඳ සහතිකපත්‍ර ලබාදීමේ ආයතනයක් බවට පත්වීම හා අධ්‍යාපනික මධ්‍යස්ථාන තුනක් ස්ථාපිත කිරීම.
- ඵලදායිතා ස්වර්ණ සම්මානය දිනා ගැනීමට කටයුතු සිදු කිරීම.
- පෙරහැර කටයුතු සඳහා පුහුණු කරන ලද අලි සංචිතයක් පවත්වාගෙන යාම.
- අලින්ගේ සුඛසාධනය හා රැකවරණය සහතික කරමින් අලි සංරක්ෂණ වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- හොඳම සංචාරක මධ්‍යස්ථානයට හිමි සහතික පත්‍රය ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.
- අලිඇතුන්ගේ සුඛසාධනය හා රැකවරණය සහතික කරමින් අලි සංරක්ෂණ වැඩපිලිවෙලක් ක්‍රියාත්මක කිරීම.
- හොඳම සංචාරක මධ්‍යස්ථානයක් බවට පත් කර ගැනීම.

03. පරිච්ඡේදය
වසරේ සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය - 2022

වගු සටහන 3.1 – මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසිඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	තත්‍ය 2022 රු.	තත්‍ය 2021 රු.	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		870,600,000	1,189,160,000	ඒසිඒ-3
-	තැන්පතු		602,480,827	147,578,843	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		22,393,550	23,193,092	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**1,495,474,377**	**1,359,931,935**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**1,495,474,377**	**1,359,931,935**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		-	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		**1,495,474,377**	**1,359,931,935**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
488,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	472,649,150	443,190,194	
78,500,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	70,909,965	81,038,978	ඒසිඒ-2(ii)
2,500,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,940,188	2,115,512	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	-	
569,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**545,499,304**	**526,344,685**	
	මූලධන වියදම්				
27,000,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	20,245,539	61,986,629	
149,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	125,503,157	209,325,114	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
500,000	හැකියා වර්ධනය	14	160,000	478,400	
3,000,000	වෙනත් මූලධන වියදම්	15	-	22,008,048	
180,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**145,908,696**	**293,798,191**	
	තැන්පතු ගෙවීම්		810,133,957	534,532,519	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		20,304,166	20,400,951	ඒසිඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**830,438,123**	**554,933,470**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**1,521,846,123**	**1,375,076,346**	
749,000,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(26,371,745)**	**(15,144,411)**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**(26,371,745)**	**(15,144,411)**	ඒසිඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසිඒ-3
			(26,371,745)	**(15,144,411)**	

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

3.2 මූදල් ප්‍රවාහ ප්‍රකාශය

වගු සටහන 3.2 – මූදල් ප්‍රවාහ ප්‍රකාශය

		එස්ඒ-සී
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා		
මුදල් ප්‍රවාහ ප්‍රකාශය		
	තත්‍ය	
	2022 රු.	නැවත ගලපන ලද **2021** රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	35,173,587	16,953,204
අග්‍රිම ලැබීම්	870,600,000	1,189,160,000
අත්තිකාරම් අයකර ගැනීම්	23,414,662	23,566,058
තැන්පතු ලැබීම්	602,480,827	147,578,844
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**1,531,669,076**	**1,377,258,107**
අඩුකළා : මූදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	563,629,159	608,650,360
සහනාධාර සහ මාරුකිරීම්	1,940,188	2,115,512
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	10,158,449	2,396,151
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	824
අත්තිකාරම් ගෙවීම්	20,304,166	20,238,451
තැන්පතු ගෙවීම්	810,133,957	534,532,519
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මූදල් ප්‍රවාහය (ආ)	**1,406,165,920**	**1,167,933,817**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මූදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**125,503,157**	**209,324,290**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මූදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	125,503,157	209,325,114
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මූදල් ප්‍රවාහය (ඉ)	**125,503,157**	**209,325,114**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මූදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(125,503,157)**	**(824)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මූදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	-	**(824)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මූදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මූදල් ප්‍රවාහය (ඌ)	-	-

අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(උ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	**(824)**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	**824**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3.3 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

වගු සටහන 3.3 – මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

				ඒසීඒ-පී
2022 දෙසැම්බර් 31 දිනට				
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය				
			තත්‍ය	
	සටහන		**2022**	**2021**
			රු.	රු.
මූල්‍ය නොවන වත්කම්				
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6		6,164,621,383	6,039,118,226
මූල්‍ය වත්කම්				
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)		71,078,969	73,168,352
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3		-	-
මුළු වත්කම්			**6,235,700,352**	**6,112,286,578**
ශුද්ධ වත්කම් / ස්කන්ධය				
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්			(1,966,945,023)	(2,172,508,769)
දේපළ පිරියත හා උපකරණ සංචිතය			6,164,621,383	6,039,118,226
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ -5(බී)**			
ජංගම වගකීම්				
නැන්පතු ගිණුම්	ඒසීඒ-4		2,038,023,992	2,245,677,121
අග්‍රිම ශේෂය	ඒසීඒ-3		-	-
මුළු වගකීම්			**6,235,700,352**	**6,112,286,578**

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2022 මූල්‍ය ප්‍රකාශන වාර්තාවේ පිටු අංක 07 සිට 33 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 34 සිට 42 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදී වෙනස් කිරීම සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදු කරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී
නම : ආර්.එම්.සී.එම්.හේරත්
නිලතුර : පළාත්
දිනය : 2023.02.
ආර්.එම්.සී.එම්. හේරත්
වනජීවී හා වන සම්පත් සංරක්ෂණ
අමාත්‍යාංශය

ගණන්දීමේ නිලධාරී
නම : ආචාර්ය නිලක් ප්‍රේමකාන්ත
නිලතුර : අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2023.02.
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
අනගාරික ධර්මපාල මාවත,
දෙහිවල

ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මූදල්)/ කොමසාරිස් (මූදල්)
නම :ඒ.රාධාකෘෂ්ණන්
දිනය : 2023.02.
ඒ. රාධාකෘෂ්ණන්
ප්‍රධාන ගණකාධිකාරී
ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
දෙහිවල

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1) වාර්තාකරණ කාලපරිච්ඡේදය

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2) මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3) ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4) දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

5) දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

6) මුදල් හා මුදල් සමාන දෑ

2022 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයටකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව එම තොරතුරු මූල්‍ය ප්‍රකාශවල අදාළ පරිදී ඇතුළත් කර ගත හැක. එසේම ‘‘වාර්තාකරණ පදනම’’ යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

වගු සටහන 3.4 – ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය රු.,000

ආදායම් ක්ෙතය	ආදායම් ක්ෙතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
D100	ප්‍රවේශ පත්‍ර ආදායම	107,000	441,000	471,171	106%
D109	කුළී	3,550	12,335	11,454	93%
D103	වෙනත්	4,500	47,100	52,465	111%

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

වගු සටහන 3.5 – වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය රු.,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	569,000	569,000	545,499	96
ප්‍රාග්ධන	180,000	180,000	145,909	81

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.

අදාළ නොවේ

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වගු සටහන 3.6 - මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය රු.,000

වත්කම් ක්ෙතය	ක්ෙත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,573,960	1,573,960	-	100%
9152	යන්ත්‍රෝපකරණ	318,386	318,386	-	100%
9153	ඉඩම්	3,727,591	3,727,591	-	100%
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	100%
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	100%
9160	කෙරීගෙන යන වැඩ	544,683	544,683	-	100%
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	100%

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - ගිණුම් අංශය

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ඇමුණුම 1හි අදාළ වාර්තාව දක්වා ඇත.

04. පරිච්ඡේදය
කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

වගු සටහන 4.1 - ආයතනයේ කාර්ය සාධන දර්ශක

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම		
	100% - 90%	75% - 89%	50% -74%
අලුත්වැඩියා කරන ලද වාහන ගණන		√	
අත්පත්කරගන්නා ලද යන්ත්‍රෝපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ ප්‍රමාණය.		√	
දෙහිවල සත්වෝද්‍යානයේ සංවර්ධන කටයුතු			
වැඩ නිමවූ සිංහ අරණ			√
වැඩ නිමවූ සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථානය		√	
වැඩ නිමවූ මැකෝ අරණ			√
පින්නවල අලි අනාථාගාරයේ සංවර්ධන කටයුතු			
විදුලි බලය බෙදාහැරීමේ පද්ධතියේ	√		
වැඩ නිමවූ නව අලිමඩු	√		
වැඩ නිමවූ ප්‍රවේශ ගොඩනැගිල්ලේ වහලය සහ අනෙකුත් අළුත්වැඩියා කටයුතු	√		
වැඩ නිමවූ නරඹන්නන් සඳහා වූ ආපන ශාලාව හා වැසිකිළි පද්ධතිය		√	
හදිසි අවශ්‍යතා සඳහා හස්තීන් පිට කිරීමට සාධන ලද තාප්පය හා ගේට්ටුව	√		
පින්නවල සත්වෝද්‍යානයේ සංවර්ධන කටයුතු			
වැඩ නිමවූ අභ්‍යන්තර මාර්ග පද්ධතිය, වැසි වතුර බැස යාමේ පද්ධතිය සහ අභ්‍යන්තර විදුලිය බෙදාහැරීමේ පද්ධතිය	√		
වැඩ නිමවූ කබල්ලෑවා සඳහා වූ අරණ	√		
වැඩ නිමවූ මෝදරවත්ත රථගාල			√
වැඩ නිමවූ නරඹන්නන් සඳහා වූ වැසිකිළි පද්ධතිය			√
වැඩ නිමවූ ප්‍රවේශ ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු (water proofing work)	√		
හම්බන්තොට සෆාරි උද්‍යානයේ සංවර්ධන කටයුතු			
වැඩ නිමවූ සේවා සපයන මාර්ගය			√
වැඩ නිමවූ විදේශීය කුරුළු උයන		√	
වැඩ නිමවූ ආසියානු අලි කලාපය සහ විටා කලාපය අතර අඩි 16 උස වේන් ලින්ක් වැට ඉදිකිරීම		√	
වැඩ නිමවූ බොරළු පාර - ආසියානු අලි කලාපය			√
වැඩ නිමවූ සිංහ ගුහාව		√	

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

05. පරිච්ඡේදය
තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

වගු සටහන 5.1 - හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහන දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% – 49%	50% - 74%	75% - 100%
අරමුණු අංක 14 - තිරසාර සංවර්ධනය සඳහා සාගර , මුහුදු හා සාගර සම්පත් තිරසර භාවිතය හා සංරක්ෂණය	14.7 - දැනට පවතින මීන් මැදුර සංවර්ධනය	කුඩා දූපත් , සංවර්ධනය වෙමින් පවතින රටවල්,ළඟන සංවර්ධිත හා සියලුම රටවල් වල තිරසාර මත්ස්‍යාය සම්පත්. (ගෝලීය දළ ගෘහාශ්‍රිත නිෂ්පාදනයේ (SDP) ප්‍රතිශතයක් ලෙස)		√	
	14.7 - සත්වෝද්යානයට පැමිණෙන සංචාරකයින්ට හා මහජනතාවට මත්ස්‍යාය සම්පත් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම			√	
අරමුණු අංක15 - පරිසර පද්ධතිවල තිරසාර භාවිතය ආරක්ෂා කිරීම, තිරසාර ලෙස වනාන්තර කළමනාකරණය, කාන්තාරකරණය ට එරෙහිව සටන් කිරීම සහ ඉඩම් හායනය නතර කිරීම සහ ආපසු හැරවීම සහ ජෛව විවිධත්ව හානිය නතර කිරීම.	15.5-නැවත හඳුන්වාදීමේ අරමුණින් විශේෂයෙන් ආවේණික සහ තර්ජනයට ලක්වූ සත්ත්ව විශේෂ සඳහා සත්ත්ව අභිජනන වැඩසටහන් මෙහෙයවීම.	රක්ත දත්ත පොතේ දර්ශකයන්ට අනුව.		√	
	15-5- අධ්‍යාපන හා පර්යේෂණ මධ්‍යස්ථාන පිහිටුවීම සහ මහජනතාව දැනුවත්කිරීමේ වැඩසටහන් මෙහෙයවීම.			√	
	15-5- ශ්‍රී ලංකානු සත්ත්වයින් සඳහා සත්ත්ව සංරක්ෂණ මධ්‍යස්ථාන පිහිටුවීම.				√
	15-7-නීති විරෝධී ලෙස වනසතුන් හා සත්ත්ව කොටස් දඩයම් කිරීම හා වෙළඳාම හඳුනා ගෙන එයට අදාළ වාර්තා සැපයීම	නීති විරෝධී ලෙස වනසතුන් හා සත්ව කොටස් දඩයම් කිරීම හා වෙළඳාමේ සමානුපාතිකය.			√
	15-8-මහජනයා දැනුවත් කිරීමේ වැඩ සටහන් පැවැත්වීම. ආක්‍රමණශීලී විශේෂ සත්වෝද්‍යානයට හඳුන්වා දීම හා ඔවුන් ස්වභාවික පරිසරවලට මුදා හැරීමෙන් වැලකී සිටීම.	ආක්‍රමණශීලී සත්ත්ව විශේෂ පාලනය වැළැක්වීමට නීති සම්පාදනය කරන රටවල් වල සමානුපාතිකය.		√	
	15-9-සෘජු හා වක්‍ර රැකියා අවස්ථා සැපයීම	අයිවි ජෛව විවිධත්ව උපාය මාර්ගික සැලැස්ම අනුව ජාතික ඉලක්ක ස්ථාපනය වීමේ දියුණුව.		√	
	15.a- සත්ත්ව අරණ ඉදිකිරීම හා පුළුල් කිරීම. සත්ත්ව සංරක්ෂණය පිළිබඳ පර්යේෂණ පැවැත්වීම.	ජෛව විවිධත්වය හා පරිසර පද්ධතිය තිරසාර භාවිතය හා සංරක්ෂණය සඳහා වැය වූ ජාතික වියදම් හා කාර්‍යාලයීය සංවර්ධනය.		√	
අරමුණු අංක12 - තිරසාර පරිභෝජනය සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම	12.5-ඒකාබද්ධ අපද්‍රව්‍ය කළමනාකරණය කිරීමේ තාක්ෂණික ක්‍රම භාවිතය.	ජාතික ප්‍රතිචක්‍රීකරණ වේගය , ප්‍රතිචක්‍රීකරණ කරන ලද ද්‍රව්‍ය ටොන් ගණන.	√		
	12.5-අපද්‍රව්‍ය අවම කිරීම සඳහා සතුන් ගේ ආහාර ලැයිස්තු සමාලෝචනය කිරීම			√	
	12.5-සත්ත්ව අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය/ කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය			√	
අරමුණු අංක 6 - සැමට ජලය හා සනීපාරක්ෂාව ලබාගතහැකි බව සහ තිරසර	6.a - ජලය කාන්දුවන ස්ථාන අලුත්වැඩියා කිරීම. තැනින් තැනට ගෙනයන ජලය අපතේ යාම නතර කිරීම.	ජලය හා සනීපාරක්ෂාවෙහි ප්‍රමාණය - රජය විසින් සම්බන්ධීකරණය කරන ලද වියදම් සැලැස්මක කොටසක් වන අදාළ			√
	6.a - උද්‍යාන අලංකරණය සඳහා ගල්වලේ ජලය භාවිතා කිරීම			√	

කළමණාකරණය සහතික කිරීම.	6.a - සත්ත්ව ස්නානය සඳහා භාවිතා කරන ජලය නැවත භාවිත කිරීම සඳහා පෙරහන් පද්ධති ස්ථාපනය කිරීම.	කාර්යාල සංවර්ධන ආධාර.	√		
	6.a - පාරිසරික තුල්‍යතාවය පවත්වාගත හැකි පොකුණු නිර්මාණය කිරීම.			√	
අරමුණු අංක7 - සැමට දැරිය හැකි, විශ්වාසදායක, තිරසාර හා නවීන බලශක්තියට ප්‍රවේශය සහතික කිරීම.	7.3-බලශක්ති ඉතිරිකිරීමේ පිළිවෙත්. ආලෝකකරණය සහ උණු වතුර සඳහා සූර්ය පැනල. විදුලි වැටවල් සඳහා සූර්ය බලය. කාල පාලන ස්විච.සංවේදක භාවිතය. ආලෝකය සහ වාතාශ්‍රය සහිත ගොඩනැගිලි සැලසුම් කිරීම.අඩු බලශක්ති බල්බ සහ උපකරණ භාවිතය.	ප්‍රාථමික බලශක්තිය හා දළ දේශීය නිෂ්පාදිතය (GDP) අනුව බලශක්ති තීව්‍රතාව මැනීම.	√		
අරමුණු අංක17 - තිරසාර සංවර්ධනය සඳහා ගෝලීය හවුල්කාරිත්වය ක්‍රියාත්මක කිරීම සහ පුනර්ජීවනය ශක්තිමත් කිරීම	17.2- සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. කාර්ය මණ්ඩලය සඳහා විදේශීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ තාක්ෂණය බෙදාගැනීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.	තිරසාර සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය වන බහු පාර්ශ්වකරුවන්ගේ ඵලදායීතා සංවර්ධන අධීක්ෂණ රාමුවල ප්‍රගතිය වාර්තා කරන රටවල් ගණන.		√	

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරාගැනීමේ ජයග්‍රහන හා අභියෝග

ජයග්‍රහණ

- දුර්ලභ හා වටිනා සත්ත්ව විශේෂයන් අභිජනනය කර ගැනීමට හැකි වීම. (උදා:- කළු හංසයන්, බෙංගාලි ව්‍යාඝ්‍රයන්)

අභියෝග

- කෝවිඩ් වසංගත තත්වය හේතුවෙන් 2022 වර්ෂයේ ඉලක්කගත අභිමතාර්ථ ඉටු කර ගැනීමට නොහැකි වීම.
  - සත්ත්ව හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම හා එමඟින් නව අභිජනනයන් සිදු කිරීමට බාධා ඇති වීම.
  - නව ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා සහ දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා මුදල් ප්‍රතිපාදන සොයා ගැනීමේ දුෂ්කරතා මතුවීම.
- සාමූහිකව වැඩ කිරීමේදී එම ඉලක්ක සපුරාගැනීමට කාර්ය මණ්ඩලයේ සැමදෙනාගේම දායකත්වය එක හා සමාන නොවීම.
- තිරසර සංවර්ධන ඉලක්ක පිළිබඳව කාර්ය මණ්ඩලයේ බොහෝ දෙනෙකු දැනුවත් නොවීම.
- අලුත් යමක් කෙරෙහි එකවර නැඹුරුවීමට මැලිකමක් දැක්වීම.
- ඉලක්ක රාශියක් පැවතුනත් එම ඉලක්ක සපුරා ගැනීම සඳහා සම්පත් හිඟකම.

06 පරිච්ඡේදය
මානව සම්පත් පැතිකඩ

5.3 සේවක සංඛ්‍යා කළමනාකරණය

වගු සටහන 6.1 - සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	29	23	06
තෘතියික	02	01	01
ද්විතියික	183	146	37
ප්‍රාථමික	673	567	108

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - පාලන අංශය

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟයේ බලපෑම.

මේ වන විට මෙම ආයතනයේ මානව සම්පත් හිඟයක් ඇති අතර, ඒ හේතුවෙන් ආයතනයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව සිදු කරන සංවර්ධන කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමට බාධා ඇතිවීම හා මෙහෙයුම් කටයුතු නිසි පරිදි ඉටු කිරීමට බාධා ඇතිවීම.

6.3 මානව සම්පත් සංවර්ධනය

වගු සටහන 6.2 - මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය (රු.මී.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	මැවුම /ලබාගත් දැනුම*
				දේශීය	විදේශීය		
01	වැටුප් පරිවර්තන	03	දින 02 (2022.08.26,31)	22,500	-	දේශීය	වැටුප් පරිවර්තන
02	පශු රක්තවේදය පිළිබඳ CPD පාඨමාලාව	01	දින 09 (2022.10.12-20)	25,000	-	දේශීය	පශු රක්තවේදය පිළිබඳ දැනුම ලබා ගැනීම.
03	උත්සව කළමනාකරණය/ ඉසව් කළමනාකරණය.	02	දින 02 (2022.11.15,17)	24,000	-	දේශීය	උත්සව කළමනාකරණය/ ඉසව් කළමනාකරණය පිළිබඳ දැනුම ලබා ගැනීම.
04	හානි පාඩු හා මු.රෙ.104 යටතේ වූ පරීක්ෂණය	02	දින 01 (2022.12.02)	1,000	-	දේශීය	හානි පාඩු හා මු.රෙ.104 යටතේ වූ පරීක්ෂණය පිළිබඳ දැනුම ලබා ගැනීම.

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව - පාලන අංශය

07 පරිච්ඡේදය
අනුකූලතා වාර්තාව

වගු සටහන 7.1 - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ / අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත්කොට තිබේ.**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.3	ව්‍යාපාර නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	-		
1.4	ගබඩාඅත්තිකාරම් ගිණුම්	-		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	-		
1.6	වෙනත්	-		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	භානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත්කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට ඩැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 17/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයාගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
04	**වාර්ෂික සැලසුම් සකස්කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		

4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස්කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත්කොට තිබීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කොට තිබීම.	අනුකූල වේ		
05	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියමකොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ		
06	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1 2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස්කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(04) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත්කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි ස34(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
07	**විගණන හා කළමණාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමණාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වා තිබීම	අනුකූල වේ		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත්කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත්කර තිබීම	අනුකූල නොවේ	2022 වර්ෂය සඳහා සමීක්ෂණ කටයුතු මේ වන විට සිදුකරමින් පවතින අතර, නියමිත දිනට විගනකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	මෙම වර්ෂය තුළ දී නියමිත කාලසීමාව තුළ නිම කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දීම සිදුකර ඇත.
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ කටයුතු අවසන් වූ පසු ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරමි.	මෙම වර්ෂය තුල දී නියමිත කාල සීමාව තුල නිම කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දීම සිදුකර ඇත.
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම.	අනුකූල නොවේ	භාණ්ඩ සමීක්ෂණ	මෙම වර්ෂය තුල දී නියමිත කාල

			කටයුතු අවසන් වූ පසු ඉදිරි කටයුතු සිදු කිරීමට කටයුතු කරමි.	සීමාව තුල නිම කරන ලෙස නිලධාරීන් වෙත උපදෙස් ලබා දීම සිදුකර ඇත.
09	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම.	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු .රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.2016 දිනැති අංක 29/ දරණ රාජ්‍ය 30 3 ලේඛයේපරිපාලන චක්‍ර. 1ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම.	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබී ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් කිරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලදීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12.1	සීමාවන්වලට අනුකූල වීම.	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම.	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු .රෙ.571 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු .රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල්කර තිබීම	අනුකූල වේ		
14.3	මු .රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන	අනුකූල වේ		

	පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම .			
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස්කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම.	අනුකූල වේ		
15.2	රැස්කර තිබූ ආදායම, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායම් ගිණුමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව, හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17.	**මහජනයා වෙත තොරතුරු ලබාදීම.**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම.	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම.	අනුකූල වේ		
17.3	තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත්කර තිබීම	අනුකූල නොවේ	පොදු අධිකාරිය සතු වගකීමක් ලෙස පනතේ සඳහන් කර ඇත.	
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම.**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කණමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසිලාණී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස්කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම.**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස්කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සජමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	මාණ්ඩලික නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 08/1998 ප්‍රකාරව සහ අනෙකුත් නිලධාරීන් සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/97 ප්‍රකාරව කාර්ය	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 ප්‍රකාරව වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කිරීම.

			සාධන ගිවිසුම් අත්සන් කරනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයෙන් බහුතරය ප්‍රාථමික ශ්‍රේණියේ නිලධාරීන් වන බැවින් 02/2018 හි සඳහන්වාර්ෂික කාර්ය සාධන ආකෘතිය භාවිතා කිරීම ප්‍රායෝගිකව අපහසු වේ.	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුනතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කොට තිබීම.	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගනන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

මූලාශ්‍රය : ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

- අවසානය -

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව
අනගාරික ධර්මපාල මාවත
දෙහිවල
0112712751-3
www.nationalzoo.gov.lk
zoosl@slt.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එස්ඩබ්එල්/සී/ඩීඑන්ඉසෙඩ්/02/22/01 මබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 18 දින

ගණන්දීමේ නිලධාරී

ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තා

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 294 - ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018අංක 19දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී .2 018අංක 19දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ .2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූලධන වියදම්

සමාලෝචිත වර්ෂයේ මූලධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා වෙන් කළ ප්‍රතිපාදනවලින් රු.527,920 ක් වැය කර මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම සිදු කර එම අගය මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දේපළ පිරියත හා උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි.

1.6.2 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම

මියගිය නිලධාරීන් 08 දෙනෙකුගෙන් රු.478,872 ක්, විශ්‍රාම ගිය නිලධාරීන් 12 දෙනෙකුගෙන් රු.999,225 ක්, සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 17 දෙනෙකුගෙන් රු.932,925 ක් හා වැඩ තහනම් කර ඇති නිලධාරීන් 18 දෙනෙකුගෙන් රු.1,241,349 ක් වශයෙන් එකතුව රු.3,652,371 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණු අතර එයින් රු.1,104,071 ක් වසර 05 කට වැඩි කාලයක සිට නිහ නිටව පැවතුණි.

1.6.3 තැන්පතු ගිණුම් ශේෂ

ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ACA 4 ආකෘතියේ සඳහන් අවසාන තැන්පතු ශේෂය සමාලෝචිත වර්ෂයේ එම ආකෘතියේ ආරම්භක ශේෂය සමඟ සැසඳීමේදී අංක 6000-0-0-16-74 දරන කොන්ත්‍රාත් රැඳවුම් මුදල් තැන්පතු ගිණුමේ පෙර වර්ෂයේ රු.55,600,288 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂයේ රු.55,811,277 ක් වශයෙන් රු.210,989 ක් වැඩියෙන් ද, අංක 6000-0-0-18-81 දරන ව්‍යවස්ථාපිත ගෙවීම් වෙනුවෙන් වූ තාවකාලික රඳවා ගැනීම් පෙර වර්ෂයේ රු.1,472,620 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂයේ රු.1,470,490 ක් වශයෙන් රු.2,130 ක් අඩුවෙන් ද දක්වා තිබුණි.

1.6.4 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පාඩු ලේඛනයක් පවත්වා ගෙන යා යුතු වුවත් දෙපාර්තමේන්තුව විසින් එම ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතික වීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායී ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත නිරීක්ෂණයන් සිදු කෙරේ.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(අ) මුදල් රෙගුලාසි 395	මාසයක් අවසන් වී එළඹෙන ඊළඟ මාස 15 වන දිනට පෙර පවතින බැංකු ගිණුම් සම්බන්ධයෙන් බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කළ යුතු වුවද, දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමට අදාළ සමාලෝචිත වර්ෂයේ සියලුම බැංකු සැසඳුම් ප්‍රකාශ දින 05 ක සිට දින 46 ක කාලයක් ප්‍රමාද කර පිළියෙල කර තිබුණි.
(ආ) මුදල් රෙගුලාසි 571(2)	ඉකුත් වූ තැන්පතු රාජ්‍ය ආදායමට හෝ අදාළ ගිණුමට බැරකළ යුතු වුවද, තැන්පතු ගිණුම් තුනකට අදාළ වර්ෂ 02 ක් ඉක්ම වූ වටිනාකම රු.34,820,423 ක තැන්පතු 138 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. තවද, ඉකුත් වූ තැන්පතු පිළිබඳව අර්ධ වාර්ෂික ලැයිස්තු පිළියෙල කිරීමට ද කටයුතු කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

---.

3.1.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

2019 වර්ෂයේ ආරම්භ කළ පින්නවල සත්වෝද්‍යානයේ වානර දුපතෙහි ඉදිකිරීම් කටයුතු 2021 වර්ෂය වන විට සම්පූර්ණයෙන් නිම කර තිබුණ ද, වසරකට අධික කාලයක් එම පරිශ්‍රයට සතුන් (වානරයන්) මුදා නොහැර නිෂ්කාර්යව පැවතුණි.

3.1.2 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

(අ) ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව විසින් ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය සමඟ රු.176,281,496 ක ඉදිකිරීම් ව්‍යාපෘති 06 ක් සඳහා ඵළැඹී තිබූ ගිවිසුම් පරිදි එම ආයතනය කටයුතු නොකිරීම හේතුවෙන් ප්‍රසම්පාදන කමිටු තීරණය පරිදි එම ව්‍යාපෘතිවලට අදාළ කොන්ත්‍රාත්තු අවසන් කර (Terminate) තිබුණ ද, අතර මඟ නවතා දමා තිබුණු එම ව්‍යාපෘති නැවත නව කොන්ත්‍රාත්කරුවකුට ලබා දීමට කටයුතු නොකිරීම හේතුවෙන් එම ඉදිකිරීම් වෙනුවෙන් දරන ලද රු.69,558,270 ක් නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. ඉන් ව්‍යාපෘති 04 ක් සඳහා ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය වෙත ලබා දී තිබූ වැඩ මූලික අත්තිකාරම් (Mobilization Advance) මුදලෙන් රඳවා ගැනීම් මුදල් ගැලපීමෙන් පසු රු.14,360,310 ක මුදලක් තව දුරටත් අය කර ගත යුතුව තිබුණි.

(ආ) 2018 වර්ෂයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ පින්නවල සත්වෝද්‍යානයට අයත් මෝදරවත්ත රථ නැවතුම්පළේ ඉදිකිරීම් කටයුතු අවසන් නොකර 2020 වර්ෂයේදී අතර මඟ නවතා දමා තිබුණු අතර ඉදි කෙරෙමින් පැවති මුර කුටිය හා වැසිකිළි පද්ධතිය වල් බිහිවී විනාශ වී පැවතුණි.

(ඇ) 2018 වර්ෂයේදී ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය විසින් ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබූ පින්නවල සත්වෝද්‍යානයේ සමනල පර්යේෂණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල හා වැසිකිළි පද්ධතියේ ඉදිකිරීම් කටයුතු 2020 වර්ෂයේ සිට අතරමඟ නවතා දමා තිබුණු අතර වැසිකිළි පද්ධතියෙහි ගොඩනැගිලිවල වල්බිහිවී විනාශ වෙමින් පැවතුණි.

3.1.3 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

අක්කර 17 ක පමණ වපසරියකින් යුතු වාගොල්ල හේන නොහොත් පින්නලන්ද වත්ත නමැති ඉඩම පින්නවල අලි අනාථාගාරයට පවරා ගෙන මාස 08 ක කාලයක් ගත වී තිබුණු නමුත් ඉඩමේ මායිම් ලකුණු කර ඉඩම ආරක්ෂා කර ගැනීමටත් අදාළ අරමුණු ඉටුකර ගැනීමටත් අවශ්‍ය කටයුතු කර නොතිබුණි.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට 887 ක් වූ අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු 163 ක් වූ අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 06 ක්, ද්විතියික මට්ටමේ තනතුරු 01 ක් හා තෘතියික සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 156 ක් පුරප්පාඩු වී පැවතුණි. විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	29	23	6
ද්විතියික මට්ටම	2	1	1
තෘතියික මට්ටම	183	146	38
ප්‍රාථමික මට්ටම	673	565	118
එකතුව	**887**	**735**	**163**

(ආ) තෘතියික සේවා ගණනයට අයත් සංවර්ධන නිලධාරී තනතුරක් හා ප්‍රාථමික සේවා ගනයට අයත් ක්ෂේත්‍ර සහායක තනතුරු 10 ක අතිරික්තයක් පැවතුණි. විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	තනතුර	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
තෘතියික මට්ටම	සංවර්ධන නිලධාරි	58	59	01
ප්‍රාථමික මට්ටම	ක්ෂේත්‍ර සහායක	106	116	10

ආර්. එම්. එම්. එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

ආර්.එම්.එම්.එස්. පෙරේරා
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත් : ලේකම් - වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය
අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව